මෙයට බේරුවල නගර සභා සීමාව ඇතුළත වදකහවෙල පිහිටි, "මිදිගහඕවිටකට්ටිය" සහ මහතලන්ගහඕවිට සහ තලන්ගහඕවිටකට්ටිය කොටසකින් ලොට් A නමැති ඉඩමේ අංක 1512A දරන පිඹුරේ ලොට් A2 (අඩි 10ක් පළල පොදු ප්‍රවේශ මාර්ගය) වන බෙදා වෙන් කළ උතුරට : එකී අංක 540 දරන පිඹුරේ ලොට් B ද, නැගෙනහිරට : අංක 540 දරන පිඹුරේ ලොට් C (අඩි 10ක් පළල පාර සඳහා වෙන් වූ බිම්) ද, දකුණට : මෙම ඉඩමේ ලොට් A3 ද, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් A1 ද යන මායිම් ඇතුළත එකී අංක 1512A දරන පිඹුර ප්‍රකාර පර්චස් එකකුත් දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 1.25) නොහොත් හෙක්ටයාර් 0.00316ක් බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කට්ටිය මතින් මාර්ග අයිතිය ද වේ.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 2.

07-991

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංක : එස්-2/70684/පීඒ2/077, 01/600/02/966/එක්ස්2/897.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2010.03.24 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

කඩවත සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ඒ. හේමචන්ද්‍ර සහ එන්. කේ. විජේතුංග විසින් සහතික කරන ලද 2000.06.04 සහ 2008.07.22 දින හා අංක 3807 හා 339 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, වැබොඩ පදිංචි වැලිමන්න ගමගේ නිලන්ති කොස්ගොල්ලවත්ත සහ අල්ගම අප්පුහාමිලාගේ දොන් උපුල් කිත්සිරි කුමාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.03.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ තිස්හය දහස් තුන්සිය හැත්තෑහයයි ශත හතලිස් තුනක් (රු. 1,36,376.43) සහ රුපියල් තුන්ලක්ෂ හයදහස් අටසිය හතලිස් දෙකයි ශත අනූනවය (රු. 3,06,842.99) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3807 සහ 339 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් තිස්තුනයි ශත හැට දෙකක් (රු. 33.62) සහ රුපියල් එකසිය අසූ හතරයි ශත අනූපහ (රු. 184.95) ක් බැගින් වැඩිදුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, නුගේගොඩ, පාගොඩ පාර, අංක 3හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ (අංක 02 නරාවල උප කාර්යාලය) මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ ගෝනහේන ගමේ පිහිටි ගලබොඩවත්ත නමැති ඉඩමට 1997.01.19 දින බලයලත් මිනින්දෝරු ඩී. සී. එම්. එස්. විමලරත්න විසින් මැන සකසන ලද අංක 18/1997 දරන පිඹුරේ කැබලි අංක වයි ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 12.5ක් බිම් කොටස.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 430/254 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස බලයලත් මිනින්දෝරු ඩී. සී. එම්. එස්. විමලරත්න විසින් මැන සකසන ලද අංක 226/1995 දරන පිඹුරේ කැබලි අංක සී (මාර්ග අයිතිය ද සමග) සහිත කොටස වේ.

අයි. විමලසේන,
වැඩබලන සාමාන්‍යාධිකාරී.

2010 ජූලි මස 15 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

07-954/1

## සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ජේ. වීරසේන, ඩබ්ලිව්. ඒ. ඩී. වී. වනසිංහ සහ එස්. වලතර විසින් ලියා සහතික කරන ලද අංක 579/692/1618 හා 2008 අප්‍රේල් මස 28, මැයි 7 හා ජූනි 6 දින දරන උකස් බැඳුම්කර ද ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. පුංචිහේවා ලියා සහතික කළ අංක 8620 හා 2007 ජූලි 23 දින ද, ජේ. වීරසේන ලියා සහතික කළ අංක 654 හා 2008.12.30 දින ද දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම් "හංස ට්‍රේඩිං කොම්පැනි" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස කෙසෙල්වත්තේ ව්‍යාපාරය කරගෙන යන අජිත් පුෂ්පකුමාර දැදිගම යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2010 ජනවාරි මස 31 වැනි දිනට ඉහත කී අංක 579/692/1618, 8620 හා 654 දරන උකස් බැඳුම්කරය මත එකී අජිත් පුෂ්පකුමාර දැදිගම යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් විසිදෙලක්ෂ නවදහස් දෙසියතිස් හයකුත් ශත හතලිස් තුනක (රු. 22,09,236.43) මුදලක් හා 2010 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පන්ලක්ෂ දහදහස් හයසිය හතකුත් ශත පහළොවක් (රු. 5,10,607.15) සඳහා වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් පොළිය ද. රුපියල් දහහතර ලක්ෂ හැත්තෑ නව දහස් නවසිය හතලිස් හයකුත් ශත අනූ අටක් (රු. 14,79,946.98) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලි අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) වර්ෂයකට සියයට දහයක් (10%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් විසිදෙලක්ෂ නවදහස් දෙසියතිස් හයකුත් ශත හතලිස් තුනක (රු. 22,09,236.43) මුදල සහ 2010 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පන්ලක්ෂ දහදහස් හයසිය හතකුත් ශත පහළොවක් (රු. 5,10,607.15) සඳහා වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් පොළිය ද, රුපියල් දහහතර ලක්ෂ හැත්තෑ නව දහස් නවසිය හතලිස් හයකුත් ශත අනූ අටක් (රු. 14,79,946.98) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලි අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) වර්ෂයකට සියයට දහයක් (10%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව අයකර

ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 579/692/1618, 8620 හා 654 දරන උකස් බැඳුම්කර මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය එහි ගොඩනැගිලි හා වෙනත් දේ සහ මාර්ග අයිතිය සමග කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 579/692/1618, 8620 හා 654 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, පානදුර තල්පිටි දෙබැද්දේ, පානදුර තොටමුනේ, පානදුර ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, කෙසෙල්වත්ත උප කාර්යාල බල ප්‍රදේශයේ කෙසෙල්වත්ත දිග්ගල පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ජී. සී. සිරිසෝම මැන සකස් කළ අංක 4719 හා 2002.01.10 දින දරන පිඹුරේ මහකිත්ගම, ලොට් අංක 43න් ලොට් අංක 43A ලෙස දැක්වෙන බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : P. P. Ka 2434 දරන පිඹුරේ ලොට් අංක 44 ද, නැගෙනහිරට : P. P. Ka 2434 දරන පිඹුරේ ලොට් අංක 46 (පාර සඳහා වෙන්කළ බිම) ද, දකුණට : P. P. Ka 2434 පිඹුරේ ලොට් අංක 66 (පාර) ද, බස්නාහිරට : ලොට් අංක 43 ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 4719 දරන පිඹුර ප්‍රකාර පර්චස් අටක් (අ. 0, රූ. 0, පර්. 8) බිම් ප්‍රමාණයකින් යුත් ඉඩමේ බිම් ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 2.

07-992

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. අයි. වැත්තෑව විසින් ලියා සහතික කරන ලද අංක 2376 හා 2004.06.29 දින ද අංක 3036 හා 2005.08.18 දින ද අංක 3402 හා 2006.03.28 දින ද අංක 3859 හා 2006.12.19 දින ද දරන උකස් බැඳුම්කර මත සහ කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ගුණවර්ධන ලියා සහතික කළ අංක 4630 හා 2008.07.04 දින සහ අංක 4575 හා 2008.04.22 දින දරන උකස් බැඳුම්කර මත ද අයවිය යුතු මුදල් ගෙවීම "මහින්ද ටෙක්ස්ටයිල්ස් " යන නාමය අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස අඹන්පොල ව්‍යාපාරය කරගෙන යන අඹන්පොල ගමගේ සරත් එරාන් කරුණාරත්න සහ හේරත් මුදියන්සේලාගේ වසන්තා කුමාරි හේරත් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2010 මාර්තු මස 31 වැනි දිනට ඉහත කී ගමගේ සරත් එරාන් කරුණාරත්න සහ හේරත් මුදියන්සේලාගේ වසන්තා කුමාරි හේරත් යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හැටදෙලක්ෂ හැත්තෑ තුන් දහස් තුන්සිය හැටපහකුත් ශත තිස් අටක (රු. 62,73,365.38) මුදලක් සහ 2010 අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක්ලක්ෂ තිස්නව දහස් හැට හතකුත් ශත විසිඑකක (රු. 1,39,067.21) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ආරම්භව ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) වර්ෂයකට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකයක් වන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන හා එසේ නියම කරන අනුපාතිකය වර්ෂයකට 22%ට වැඩි නොවිය යුතු හා වර්ෂයකට 17%ට අඩු නොවිය යුතු අනුපාතිකයක් මත පොලිය ද,

රුපියල් තුන්ලක්ෂ තිස්පන්දහස් තුන්සිය හැට අටක් (රු. 3,35,368) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ආරම්භව ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) වර්ෂයකට සියයට හතයි දශම පහක් (7.5%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකයක් මත පොලිය ද,

රුපියල් හත්ලක්ෂ දහඅට දහස් පනහක් (රු. 7,18,050) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ආරම්භව ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකයක් මත පොලිය ද,

රුපියල් තිස්පන් ලක්ෂ අසූහය දහස් නවසිය තිස් එකක් (රු. 35,86,931) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතිකය අතරින් එනම්,

(අ) බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය හෝ,

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන වාර්ෂික අනුපාතිකය,

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට සියයට නවයක (9%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද (මෙම පොළී අනුපාතිකය එක් එක් වර්ෂයේ තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලැබේ.)

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය විය යුතු මුදල වන රුපියල් හැට දෙලක්ෂ හැත්තෑතුන් දහස් තුන්සිය හැටපහකුත් ශත තිස් අටක (රු. 62,73,365.38) මුදල් සහ 2010 අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක් ලක්ෂ තිස්නව දහස් හැට හතකුත් ශත විසි එකක (රු. 1,39,067.21) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ආරම්භව ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) වර්ෂයකට සියයට අටක් (8%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහළ 0.5%ට

තීන්දු කරන හා එසේ නියම කරන අනුපාතිකය වර්ෂයකට 22%ට වැඩි නොවිය යුතු හා වර්ෂයකට 17%ට අඩු නොවිය යුතු අනුපාතිකයක් මත පොලිය ද,

රුපියල් තුන්ලක්ෂ තිස්පන්දහස් තුන්සිය හැට අටක් (රු. 3,35,368) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ආරම්භව ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) වර්ෂකයට සියයට හතයි දශම පහක (7.5%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකයක් මත පොලිය ද,

රුපියල් හත්ලක්ෂ දහඅට දහස් පනහක් (රු. 7,18,050) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ආරම්භව ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) වර්ෂයකට සියයට හත (7%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකයක් මත පොලිය ද,

රුපියල් තිස්පන් ලක්ෂ අසූහය දහස් නවසිය තිස් එකක් (රු. 35,86,931) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්,

(අ) බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය හෝ,
(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලි අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන වාර්ෂික අනුපාතිකය.

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට සියයට නවයක (9%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොලිය (මෙම පොලි අනුපාතිකය එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලැබේ.) හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 2376, 3036, 3402, 3859, 4630, 4575 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වෙයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2376, 3036, 3402, 3859, 4630 සහ 4575 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 2376, 3036, 3402, 3859 හා 4575 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගන්තිහේ කෝරළේ, වන්නි හත්පත්තුවේ, අඹන්පොල ග්‍රාමයේ පිහිටි "බෙරික්වත්ත" නමැති ඉඩමේ ලොට් 2බී ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක විසින් මැන සකස් කළ අංක 3630/97 හා 1997.09.05 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 2බී ලෙස ලකුණු කළ බිම් කට්ටියට එකී පිඹුරු ප්‍රකාර මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් අංක 2 ද, නැගෙනහිරට සහ දකුණට : බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් මැන සකස් කළ අංක 48/83 දරන පිඹුරේ ලොට් අංක 7 ද, බස්නාහිරට : අනුරාධපුර-කුරුණෑගල ප්‍රධාන පාර ද යන මායිම් ඇතුළත පර්චස් පහක් (අ. 0, රූ. 0, පර්. 5) බිම් ප්‍රමාණයෙන් යුක්ත ඉඩම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

**අංක 4630 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගන්තිහේ කෝරළේ, වන්නි හත්පත්තුවේ, අඹන්පොල ග්‍රාමයේ පිහිටි "බෙරික්වත්ත" නමැති ඉඩමේ ලොට් 9ඒ ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක විසින් මැන සකස් කළ අංක 6756/2001 හා 2001.10.12 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 9ඒ ලෙස ලකුණු කළ බිම් කට්ටියට එකී පිඹුරු ප්‍රකාර මායිම්, උතුරට : අංක 80/83 දරන පිඹුරේ ලොට් අංක 14 ද, නැගෙනහිරට : ඉහත සඳහන් අංක 6756/2001 දරන පිඹුරේ ලොට් 09බී ද දකුණට : බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක මැන සකස් කළ අංක 4133/98 දරන පිඹුරේ ලොට් අංක 08 ලකුණු කළ පාර ද, බස්නාහිරට : පාර ද යන මායිම් තුළ පර්චස් දහයකුත් දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 10.25) බිම් ප්‍රමාණයෙන් යුක්ත ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ සහ ඉහත කී අංක 4133/98 දරන පිඹුරේ ලොට් අංක 08 ලකුණු කළ පාර පොදුවේ පාවිච්චි කිරීමේ හා නඩත්තු කිරීමේ අයිතිවාසිකම ද වේ.

මෑතකදී කරන ලද මැනීමකට අනුව එම ඉඩම දැනට ඉහත කී අඹන්පොල පිහිටි "බෙරික්වත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. පී. වීරක්කොඩි මැන සකස් කළ අංක 2008.02.11 හා 2008.02.12 දින දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණු කළ උතුරට : අංක 80/83 දරන පිඹුරේ ලොට් අංක 14 ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක මැන සකස් කළ අංක 6756/200 දරන පිඹුරේ ලොට් 09බී ද, දකුණට :අඩි පාර ද, බස්නාහිරට : අඩිපාර ද යන මායිම් ඇතුළත පර්චස් නවයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 9.5) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගහකොල, වැවිලි සහ වෙනත් සියලු දේ යනුවෙන් විස්තර කර තිබේ.

ඒ. එන්. පොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

07-990

---

**මහජන බැංකුව - මැදවච්චිය ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.26 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් සෙනෙවිරත්න මුදියන්සේලාගේ දීපදු කුමාරි මහත්මිය විසින් සහතික කරන ලද 2007.12.24 දිනැති අංක 2820 දරන උකස්කරය ප්‍රකාර මැදවච්චිය, මන්නාරම් පාර, සමගිපුර හි

පදිංචි උපුල් ප්‍රියන්ත කොඩිතුවක්කු සහ පලන්ගල ලියනගේ ගුණවතී ද සිල්වා යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් පන්ලක්ෂ හැත්තෑහතර දහස් අටසිය විසි අටයි ශත විසිදෙකක (රු. 5,74,828.22) මුදලක් දැනට මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින් ද, 2009.12.16 දින සිට වර්ෂයකට සියයට විස්සක (20%) බැගින් රුපියල් පන්ලක්ෂ හැත්තෑහතර දහස් අටසිය විසිඅටයි ශත විසිදෙක (රු. 5,74,828.22)ක මුදලක් සඳහා වෙන්දේසි දින දක්වා තවදුරටත් පොළිය සහ වෙන්දේසි ගාස්තු ඇතුලුව වෙනත් ගාස්තු ඇත්නම් ඒවා ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් පන්ලක්ෂ හැත්තෑහතර දහස් අටසිය විසිඅටයි ශත විසිදෙක (රු. 5,74,828.22) ක මුදලක් අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 2820 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩවත් පත්තුවේ/කෝරළේ අංක 67-මැදවච්චිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කුඩා මැදවච්චිය නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. 6196 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අ. ග. පි. 112 දරන රේඛා සටහනනේ අංක 270 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ රජයේ ඉඩම් කට්ටියට මායිම්, උතුරට : කැබලි අංක 269 සහ 268, නැගෙනහිරට : කැබලි අංක 268 සහ 271, දකුණට : කැබලි අංක 271, බස්නාහිරට : කැබලි අංක 271 සහ 269 යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බින්දුවයි දශම දෙකයි බින්දුවයි දෙකයි තුන (හෙක්. 0.2023)ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, නිවාස, ගහකොළ, පළතුරු ආදී සෑම සියළුදේත් වෙයි.

මෙම දේපළ අනුරාධපුර ඉඩම් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ 650/177 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කලාපීය සහකාර සාමාන්‍යාධිකාරී,
(උතුරු මැද කලාපය).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අනුරාධපුරය.

07- 949

---

## මහජන බැංකුව - කළුතර ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.10.31 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. ද සිල්වා විසින් මහජන බැංකුවේ නමට ලියා සහතික කරන ලද 2007.11.15 දිනැති අංක 2147, 2008.02.07 දිනැති අංක 2260, 2008.02.07 දිනැති අංක 2262 සහ 2008.02.07 දිනැති අංක 2264 දරන උකස්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, සීමාසහිත කළුතර සමූපකාර සුරාබදු සංගමය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 2147 දරන උකස්කරය මත රුපියල් තිස්පන්දහස් දෙසිය අනූ අටයි ශත තිස්හතක (රු. 35,298.37) මුදලක් ද, අංක 2260 දරන උකස්කරය මත රුපියල් හතලිස්එක්ලක්ෂ එකොලොස්දහස් නවසිය අනූනවයයි ශත පනස්පහක (රු. 41,11,99.55) මුදලක් ද අංක 2262 දරන උකස්කරය මත රුපියල් විසිඅටලක්ෂ හතලිස් නවදහස් එකසිය හතලිස්පහයි ශත හතක (රු. 28,49,145.07) මුදලක් සහ අංක 2264 දරන උකස්කරය මත රුපියල් දසලක්ෂයක (රු. 10,00,000) මුදලක් මහජන බැංකුවට දැනට ලැබිය යුතු සහ අයවිය යුතුව බැවින් ද, 2008.12.17 වැනි දින සිට වර්ෂයකට 14% (සියයට දහහතර) බැගින් රුපියල් තිස්පන්දහස් දෙසිය අනූඅටයි ශත තිස්හතක (රු. 35,298.37) මුදල සහ 2009.04.07 වැනි දින සිට වර්ෂයකට 16% (සියයට දහසය) බැගින් රුපියල් හතලිස්එක්ලක්ෂ එකොලොස්දහස් නවසිය අනූනවයයි ශත පනස්පහක (රු. 41,11,999.55) මුදල, 2009.04.07 දින සිට වර්ෂයකට 16% බැගින් රුපියල් විසිඅටලක්ෂ හතලිස් නවදහස් එකසිය හතලිස්පහයි ශත හතක (රු. 28,49,145.07) මුදල සහ 2008.09.25 වැනි දින සිට වර්ෂයකට 21% බැගින් රුපියල් දසලක්ෂයක (රු. 10,00,000) මුදල සඳහා දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය සහ වෙන්දේසි ගාස්තු ද එකී මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරගත හැකි මුදල් ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර සමන්මලී රාමනායක විසින් එකී අංක 2147, 2260, 2262 සහ 2264 දරන උකස්කර මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍ර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුනේ දකුණ පයියාගල බද්දෙහි මාලේගොඩ පිහිටා ඇති බලයලත් මිනින්දෝරු වී. පී. ඩයස් විසින් මැන සාදන ලද 1949.11.30 දිනැති අංක 92 දරන පිඹුරේ නිරූපිත හාගොඩ කන්ද හෙවත් අඹගහවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : රජයට අයත් ඇළ වඩාත් නිවැරදිව ඕවිට සහ නැගෙනහිරට සහ දකුණට : ප්‍රැන්සිස් අප්පුහාමි හිමිකම් කියන ඕවිට සහ පොතුකුඹුර හෙවත් මන්ගිලියා ඕවිට වඩා නිවැරදිව පොතුඕවිට සහ බටහිරට : එම ඉඩමේ හතරෙන් එක කොටස වඩා නිවැරදිව එම ඉඩමේ කොටස ද, යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර තුනයි පර්චස් තිස්දෙකක් (අ. 3, රූ. 0, පර්. 32) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ, වැවිලි ආදි සියළු දේද වේ. මෙම ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H251/243 යටතේ ලියාපදිංචි කර ඇත.

### උපලේඛනය

ඉහත කී පයියාගල බද්දෙහි කුඩා පයියාගල පිහිටා ඇති බෙදා වෙන් කරන ලද ගොඩැල්ලවත්ත නැමැති ඉඩමට මායිම්, උතුරට : අඹගහවත්ත සහ කන්දේවත්ත, නැගෙනහිරට : පොතුඕවිට සහ අඹගස්වත්ත, දකුණට : ඇන්ඩියවත්ත සහ බටහිරට : පෙහෙට්ටියවත්ත යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර තුනක් (අ. 3, රූ. 0, පර්. 0) විශාල ඉඩම. මෙම ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H251/244 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී පයියාගල බද්දෙහි කුඩා පයියාගල පිහිටා ඇති අඹගහවත්ත නමැති ඉඩමට මායිම්, උතුරට : හාගොඩ කන්ද දකුණු කොටස ද, නැගෙනහිරට : පොතුකුඹුර ඕවිට ද, දකුණට : ගොඩැල්ලවත්ත සහ බටහිරට : කන්දේවත්ත සහ ගඟද යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර දෙකක්

(අ. 2, රූ. 0, පර්. 0) විශාල ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 251/245 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී පයියාගල බද්දෙහි කුඩා පයියාගල පිහිටා ඇති ඉහත කී අංක 92 දරන පිඹුර ප්‍රකාරව හක්ගොඩකන්ද හෙවත් අඹගහවත්තට ලඟාවන බෙදා වෙන් කරන ලද පහළවත්ත නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : අන්දිවත්ත (යෝජිත පාර), නැගෙනහිරට සහ බටහිරට : පහළ වත්ත කොටස සහ දකුණට : පයියාගල සිට දොඩන්ගොඩ දක්වා ඇති ප්‍රධාන මාර්ගය ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් පහයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 5.4) විශාල ඉඩම. මෙම ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H251/246 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී අන්ගන්ගොඩ පිහිටා ඇති හග්ගොඩකන්ද හෙවත් අඹගහවත්තේ හතරෙන් එක කොටස නමැති ඉඩමෙන් ඩිස්ටිලර් පරිශ්‍රයට ලඟාවන ප්‍රවේශ මාර්ගය වන ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු පී. ජී. ඩයස් විසින් මැන සාදන ලද 1949.11.30 දිනැති අංක 92 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, නැගෙනහිරට : හක්ගොඩ කන්දේ (ඩිස්ටිලරි වැඩබිම) හතරෙන් තුනක (3/4) කොටස ද, උතුරට සහ දකුණට : එම ඉඩමේ කොටස සහ බටහිරට : අඹගහවත්ත නමැති ඉඩම හරහා දිවෙන යෝජිත පාරේ කොටසක් ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් පහයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 5.3) විශාල ඉඩම. මෙම ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H251/247 යටතේ ලියාපදිංචිකර ඇත.

ඉහත කී අන්ගන්ගොඩ පිහිටා ඇති අඹගහවත්ත නමැති ඉඩමෙන් ඩිස්ටිලරි පරිශ්‍රයට ලඟාවන ප්‍රවේශ මාර්ගය වශයෙන් බලයලත් මිනින්දෝරු පී. ජී. ඩයස් විසින් මැන සාදන ලද 1949.11.30 දිනැති අංක 92 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුර සහ දකුණට : අඹගහවත්තේ ඉතිරි කොටස, නැගෙනහිරට : හන්ගොඩකන්ද හරහා යන මාර්ගයේ කොටසක් සහ දකුණ බටහිරට : ගොඩැල්ලවත්ත හරහා දිවෙන මාර්ගයේ ඉතිරි කොටස ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 10.2) විශාල ඉඩම. මෙම ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H251/248 යටතේ ලියාපදිංචිකර ඇත.

ඉහත කී අන්ගන්ගොඩ පිහිටා ඇති ගොඩැල්ලවත්ත නමැති ඉඩමෙන් ඩිස්ටිලරි පරිශ්‍රයට ලඟාවන ප්‍රවේශ මාර්ගය වශයෙන් බලයලත් මිනින්දෝරු පී. ජී. ඩයස් විසින් මැන සාදන ලද 1949.11.30 දිනැති අංක 92 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අඹගහවත්ත හරහා යන මාර්ගයේ කොටසක් ද, නැගෙනහිරට සහ බටහිරට : අඹගහවත්තේ ඉතිරි කොටස සහ දකුණට : අන්දිවත්ත හරහා යන මාර්ගයේ කොටස ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 12.4) විශාල ඉඩම. මෙම ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H251/249 යටතේ ලියාපදිංචිකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
කළුතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන නිලධාරී (කළුතර),
අංක 341, ගාලු පාර,
පානදුර.

07- 943

## මහජන බැංකුව - මොරටුමුල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.09.25 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් චන්ද්‍රිමා ඉඳුරුව මහත්මිය විසින් සහතික කරන ලද 2006.04.20 දිනැති අංක 2442 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම, ලක්ෂපති විදානලාගේ ජයලත් නිශාන්ත ද මැල් මයා, වන්නකුවත්ත වඩුගේ මිලී කැතරින් ප්‍රනාන්දු මිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හාරලක්ෂ විසිදහස් එකසිය අනූතුනයි ශත පනස් එකක (රු. 4,20,193.51) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2009.03.29 දින සිට වර්ෂයකට සියයට දහසයයි දශම හතයි පහ බැගින් (16.75%) හා රුපියල් හාරලක්ෂ විසිදහස් එකසිය අනූ තුනයි ශත පනස් එකක (රු. 4,20,193.51) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29 වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් ද ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ විසිදහස් එකසිය අනූතුනයි ශත පනස් එකක් (රු. 4,20,193.51) අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර සමන්මලී රාමනායක මහත්මිය විසින් එකී අංක 2442 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුවේ මොරටුව නගර සභා සීමාව තුළ විල්ලෝරාවත්ත යන ගමේ පිහිටි, "ගල්වැටියවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එස්. මෙන්ඩිස් මහතා විසින් 1973.03.11 වැනි දින මැන සාදන ලද අංක 192 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කොටසට මායිම්, උතුරට : අඩි 10ක් පළල පාරකට වෙන් කළ කොටස ද, නැගෙනහිරට : එස්. ජෝර්ජ් සිල්වාගේ උරුමක්කරුවන්ට අයිති ඉඩම ද, දකුණට : එස්. ජෝර්ජ් සිල්වාගේ උරුමක්රුවනන්ට අයිති ඉඩම ද, බස්නාහිරට : අඩි 10ක් පළල පාරකට වෙන් කළ කොටස ද, යන මෙකී මායිම් තුළ වූ පර්චස් දහයයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 10.25) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියළු දේද වේ.

ඉහත කී ඉඩම නැවත කරන ලද මැනීමක් අනුව මෙසේ ද විස්තර වේ.

ඉහත කී විල්ලෝරාවත්ත යන ගමේ පිහිටි, ගල්වැටියවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ආර්. එස්. පොන්සේකා මහතා විසින් 1985.12.08 වැනි දින මැන සාදන ලද අංක 132 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ ඉඩමට මායිම්, උතුරට : අඩි 10ක් පළල පාරද (දැනට නිව්ටන් අයි. ද සිල්වා මාවත) ද, නැගෙනහිරට : එස්. ජෝර්ජ් සිල්වාගේ උරුමක්කරුවන්ට අයිති ඉඩම ද, දකුණට : එස්. ජෝර්ජ් සිල්වාගේ උරුමක්රුවනන්ට අයිති ඉඩම ද, බස්නාහිරට : අඩි 10ක් පළල පාර ද (දැනට නිව්ටන් අයි. ද සිල්වා මාවත) යන මෙකී මායිම් තුළ වූ, පර්චස් දහයයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 10.25) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියළු දේද වේ.

මෙම උකස්කරය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක M 2945/128 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිරි කලාප II.

ප්‍රාදේශය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත, මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

07- 947

---

**මහජන බැංකුව - මාතර ධර්මපාල මාවත ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. රූබසිංහ විසින් සහතික කරන ලද 2005.07.06 දිනැති 2397 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් මොහොන් චන්ද්‍රසිරි වික්‍රමසුරේන්ද්‍ර, ලීලාවතී වික්‍රමසුරේන්ද්‍ර යන අය විසින් පැහැර හැර ඇති එකී උකස්කර අංක 2397 යටතේ රුපියල් තුන්ලක්ෂ තිස්හත් දහස් තුන්සිය විසිපහයි ශත හතලිහ (රු. 3,37.325.40) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2009.11.06 දින සිට වර්ෂයකට සියයට දහඅටයි දශම දෙකයි පහක් (18.25%) බැගින් රුපියල් තුන්ලක්ෂ තිස්හත් දහස් තුන්සිය විසිපහයි ශත හතලිහ (රු. 3,37,325.40) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව රුපියල් තුන්ලක්ෂ තිස්හත් දහස් තුන්සිය විසිපහයි ශත හතලිහක (රු. 3,37,325,40) මුදලක් අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 2397 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29ඩී දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර සහ මහ නගර සභා සීමාව තුළ වැලිවේරිය අකුරැස්ස පාරේ වරිපනම් අංක 42හි පිහිටි වැලිවේරිය වත්ත නමැති ඉඩම කැබලි අංක "බී" බෙදූ කැබලි අංක 18ට බලයලත් මිනින්දෝරු එස්. එල්. ගලප්පත්ති මිනින්දෝරු මහතා විසින් සකස් කරන ලද 2000.08.27 දිනැති පිඹුරු අංක 252ට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : අඩි 20ක් පළල පුද්ගලික පාර, නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක 19 ද, දකුණට : මෙම ඉඩමේ කැබලි අංක "ඩී" ද, බස්නාහිරට : මෙම ඉඩමේ කැබලි අංක 17 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිතුනක් (අ. 0, රූ. 0, පර්. 23) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සැම සියලු දෙය ද වේ.

මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 432/78හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකර,
මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 215, අනගාරික ධර්මපාල මාවත,
මාතර.

07- 946

---

**මහජන බැංකුව - පානදුර ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.07.31 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් පී. රෝස් කුමාරි එන්. ප්‍රනාන්දු මිය විසින් සහතික කරන ලද 2008.10.30 දිනැති අංක 2216 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, ගෝනියාමාලිමගේ ඉසන්ත අපොන්සු කුමාරපට්ටි විදානලාගේ දෝන තේජා ප්‍රදීපිකා පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් ලක්ෂ හයක (රු. 6,00,000) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2009.04.30 දින සිට වර්ෂයකට 27% බැගින් රුපියල් ලක්ෂ හයක් (රු. 6,00,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් ලක්ෂ හයක (රු. 6,00,000) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ඊ. සමන්මලී රාමනායක විසින් එකී අංක 2216 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 531/133 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇති බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ නල්ලූරුව ග්‍රාමයේ පිහිටි "දවටගහවත්තේ කට්ටිය" නමැති ඉඩමට අවසරලත් මානක එස්. එච්. බර්නාඩ් ජෝසප් මහතා විසින් 2000.11.11 දින මැන සකස් කරන ලද අංක 10/2000 දරන පිඹුරේ කැබලි අංක "බී" දරන ඉඩමට මායිම්, උතුරට : ලොට් සී (අඩි 12ක් පළල පාර) සහ ලොට් "ඒ ", නැගෙනහිරට : මිල්ටන් ප්‍රනාන්දුට අයිති දේපළ, දකුණට : රෝහිනි ඩයස්ට අයිති දේපළ, බස්නාහිරට : ෂෙල්ටන් පෙරේරාට අයිති දේපළ යන මායිම් තුළ පිහිටි පර්චස් හය (අ. 0,රූ. 0, පර්. 6)ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි, සියළුම ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියළුම දේද් වේ.

අංක 10/2000 දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් "සී " දරන ප්‍රවේශ මාර්ගයෙහි පරවශ්‍යතා අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
කළුතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, (කළුතර),
අංක 341, ගාළු පාර,
පානදුර.

07- 945

### මහජන බැංකුව - බත්තරමුල්ල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. කේ. වැලිකුඹුර මහත්මිය විසින් සහතික කරන ලද 2007.02.02 දිනැති අංක 1542 දරන උකස්කරය හා කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජේ. කේ. එම්. මීගම මහත්මිය විසින් සහතික කරන ලද 2009.03.12 දිනැති අංක 1318 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් නවගමුවගේ දොන් චන්දන සුජීව මහතා සහ කහඳවල ආරච්චිගේ ශ්‍යාමා දිල්රුක්ෂි මහත්මිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර යටතේ රුපියල් දෙලක්ෂ අනූතුන් දහස් නවසිය අටයි ශත හතලිස් හතරක (රු. 2,93,908.44) හා රුපියල් තුන්ලක්ෂයක (රු. 3,00,000) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2010.01.10 දින සිට වර්ෂයකට සියයට දහඅටයි දශම පහ බැගින් (18.5%) හා 2009.06.18 දින සිට වර්ෂයකට සියයට විසි හතරක (24%) පිළිවෙලින් රුපියල් දෙලක්ෂ අනූතුන්දහස් නවසිය අටයි ශත හතලිස් හතරක (රු. 2,93,908.44) හා රුපියල් තුන්ලක්ෂයක (රු. 3,00,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ අනූතුන් දහස් නවසිය අටයි ශත හතලිස් හතරක (රු. 2,93,908.44) හා රුපියල් තුන්ලක්ෂය (රු. 3,00,000) මුදලක් අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 1542 හා 1318 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ බත්තරමුල්ල ඒකකය තුළ තලංගම උතුර වේල්ලට යන පාරේ පිහිටි සම්බුද්ධි "දවටගහවත්ත හෙවත් දවටගහවත්ත" නමැති ඉඩමට වරලත් මානක අයි. ටී. මාදොළ විසින් සැකසූ අංක 2003/148 සහ 2003.06.07 දින දරන පිඹුරේ ලොට් අංක 9සී අක්ෂරය දරන කැබැල්ලට මායිම්, උතුරට : එකී අංක 2003/148 දරන පිඹුරෙහි සඳහන් 9බී සහ (අඩි 10ක් පළල පාරක් සඳහා වෙන් කළ) 9ඩී අක්ෂරය දරන කැබලි ද, නැගෙනහිරට : අංක 1541 දරන පිඹුරෙහි සඳහන් කැබලි අංක 8 ද, දකුණට : එස්. ඒ. ඉන්ද්‍රසෝමට අයිති ඉඩම සහ වේල්ල සඳහා අත්හල බිම් තීරය ද, බස්නාහිරට : අංක 1541 දරන පිඹුරෙහි සඳහන් කැබලි අංක 10 ද, මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් හය (අ. 0, රූ. 0, පර්. 06)ක් හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි පහයි දෙක (හෙක්. 0.152) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියළු දේත් සහ

පහත විස්තර කරනු ලබන බිම් තීර මතින් ගමන් කිරීමේ පොදු මාර්ග අයිතිය ද වේ.

02. ඉහත කී තලංගම උතුරු, වේල්ලට යන පාරේ පිහිටි "සම්බුද්ධි දවටගහවත්ත" නමැති ඉඩමට වරලත් මානක අයි. ටී. මාදොල විසින් සැකසූ ඉහත කී අංක 2003/148 සහ 2003.06.07 දින දරන පිඹුරෙහි සඳහන් (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කළ) 9ඩී අක්ෂරය දරන කැබැල්ල කියන, උතුරට : අංක 1541 දරන පිඹුරෙහි සඳහන් කැබලි අංක 11 (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කළ) ද, නැගෙනහිරට : අංක 1541 දරන පිඹුරෙහි සඳහන් කැබලි අංක 8 ද, දකුණට : එකී අංක 2003/148 දරන පිඹුරෙහි සඳහන් 9සී අක්ෂරය දරන කැබැල්ල ද, බස්නාහිරට : එකී අංක 2003/148 දරන පිඹුරෙහි සඳහන් 9බී අක්ෂරය දරන කැබලි ද, මායිම් වූ පර්චස් දෙකයි දශම හයයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 2.60) ක් හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි හයයි පහ (හෙක්. 0.0065)ක් විශාල බිම් තීරය මතින් ද,

අංක 1541 දරන පිඹුරෙහි සඳහන් අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කළ අංක 11 දරන කැබැල්ල මතින් ද, ගමන් කිරීමේ පොදු මාර්ග අයිතිය සහ එකී බිම් තීරය උඩින් හෝ යටින් විදුලි රැහැන්, දුරකතන රැහැන්, ජලනල, කැලි කසල නල ආදිය යොදා ගැනීමේ අයිතිය ද වේ.

මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1623/147, 145හි ලියාපදිංචි වී ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිරි කලාප II

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත, මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

07- 948

---

### මහජන බැංකුව - කොච්චිකඩේ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.09 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් රුවිනි එස්. දසනායක විසින් සහතික කරන ලද 2004.03.25 දිනැති අංක 1466 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, දොන් චාල්ස් සේනානි ජයසූරිය සහ දොන් ජෙරම් ගිලිෂියන් සෙක්ස්ටස් ජයසූරිය යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී අංක 1466 උකස්කරය යටතේ දැනට රුපියල් පන්ලක්ෂ හැටපන් දහස් අටසිය (රු. 5,65,800) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2009.10.14 දින සිට වර්ෂයට 19.25% බැගින් රුපියල් පන්ලක්ෂ හැටපන්දහස් අටසියය (රු. 5,65,800) ක මුදලක් සහ රුපියල් දෙලක්ෂ විසිදහස් විසි හතරයි ශත හතලිස් හතක (රු. 2,20,024.47) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2010.01.28 දින සිට වර්ෂයකට 19.25% බැගින් රුපියල් දෙලක්ෂ විසිදහස් විසි හතරයි ශත හතලිස් හත (රු. 2,20,024.47) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා ආදල මහජන බැංකු පනතේ 29 වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පන්ලක්ෂ හැටපන් දහස් අටසියය (රු. 5,65,800) ක මුදලක් සහ රුපියල් දෙලක්ෂ විසිදහස් විසිහතරයි ශත හතලිස් හත (රු. 2,20,024.47) ක මුදල අයකර

ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩලස් කෙලාට්ස් (පුද්ගලික) සමාගම විසින් එකී අංක 1466 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව නගර සහා සීමාව තුළ අළුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, පල්ලන්සේන නැමැති ගමේ පිහිටි තෙලඹුගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. ජේ. එම්. ජී. ඩයස් මහතා විසින් 1999.10.11 දින මැන සාදන ලද අංක 2635ඒ/99 දරන පිඹුර ප්‍රකාර ලොට් බී සඳහා මායිම්, උතුරට : එන්. ජයසූරියට අයිති ඉඩම ද, නැගෙනහිරට : බී. සිරිවර්ධනට අයිති ඉඩම ද, දකුණට : පී. ප්‍රනාන්දුගේ උරුමකරුවන්ට අයිති ඉඩම ද, බස්නාහිරට : ලොට් ඒ සහ ලොට් සී ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිතුනයි දශම නවයයි එක (අ. 0. රූ. 0, පර්. 23.91) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 828/104 හි ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටස් හි මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

07- 944

---

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

වත්තල ගෙදර සුමිත් රන්ජන් ගුණසිරි.

1990 අංක 04 දරන බැංකු ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ජනවාරි මස 28 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ශාමිලා තිළිණි විජේරත්න විසින් සහතික කරන ලද (මෙහි මින්මතු "බැඳුම්කරය" වශයෙන් හඳුන්වනු ලබන) අංක 102 සහ 2004 පෙබරවාරි මස 09 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන) පන්නිපිටිය මාකුඹුර අංක 479 දරන ස්ථානයේ පදිංචි වත්තලගෙදර සුමිත් රන්ජන් ගුණසිරි යන අය විසින් ලබාගන්නා මුල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් (කලින් කොළඹ 01, යෝක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලබන) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

තවද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2009.08.18 වැනි දිනට රුපියල් විසිතුන්ලක්ෂ පනස්එක්දහස් හාරසිය හැටනවයකුත් ශත අනූපහක (රු. 23,51,469.95) මුදලක් වර්තමානයේ දී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබෙන බැවින් ද, ඉහත කී රුපියල් විසිතුන්ලක්ෂ පනස්එක්දහස් හාරසිය හැටනවයකුත් ශත අනූපහක (රු. 23,51,469.95) මුදල සහ 2009.08.18 වැනි දින නිවාස ණය මත හිඟ මුල් මුදල වන රුපියල් විසිඑක්ලක්ෂ අනූඑක්දහස් දෙසියහයකුත් ශත හැටතුනක (රු. 21,91,206.63) මුදල මත 2009.08.19 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 27.50% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති යම් මුදලක් වෙතොත් එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඕක්ෂනියර්ස් හි එම්. ඩබ්ලිව්. ත්‍රිවංක චරිත් සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මාකුඹුර ගමේ පිහිටි දූවේවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ජේ. බී. වීරකෝන් විසින් මැන සාදන ලද අංක 612 සහ 2002 ජනවාරි මස 21 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් 02 දරන බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 01 ද, නැගෙනහිරට : ඩී. ආර්. පියදාසට අයිති ඉඩම ද, දකුණට : ලොට් 03 (පාර සඳහා වෙන් කිරීම) ද, බස්නාහිරට : අංක 612 දරන පිඹුරේ ලොට් 01 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 612 දරන පිඹුර අනුව පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල බිම් කැබැල්ල ය. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1514/196 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

තවද ඉහත කී අංක 612 දරන පිඹුරේ ලොට් 03 වශයෙන් නිරූපිත පාර පුළුල් කිරීම සඳහා වෙන් කළ කොටස භාවිතා කිරීමේ අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

07-847/2

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

වික්‍රමසිංහ ආරච්චිලාගේ රොෂාන් චාමික හා ගල්ල ගමාච්චිගේ මිහිරි ගලනා මනෝහාරි.

1990 අංක 04 දරන බැංකු ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 අප්‍රේල් මස 30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කුමුදිනී දීපිකා ජයසිංහ විසින් සහතික කරන ලද (මෙහි මින්මතු "බැඳුම්කරය" වශයෙන් හඳුන්වනු ලබන) අංක 94 සහ 2004 ඔක්තෝබර් මස 06 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු "උකස්කරු" වශයෙන් හඳුන්වනු ලබන) පන්නිපිටිය මාකුඹුර අංක 349 දරන ස්ථානයේ පදිංචි වික්‍රමසිංහ ආරච්චිලාගේ රොෂාන් චාමික හා ගල්ල ගමාච්චිගේ මිහිරි ගලනා මනෝහාරි යන අය විසින් ලබාගන්නා ලද මුල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරුවන් විසින් (කලින් කොළඹ 01, යෝක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

තවද ඉහත කී උකස්කරුවන් ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2009.07.02 වැනි දිනට රුපියල් දහහතරලක්ෂ හැටඑක්දහස් අටසියඅනූඑකකුත් ශත පනස් හතරක (රු. 14,61,891.54) මුදලක් වර්තමානයේ දී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබෙන බැවින් ද, ඉහත කී රුපියල් දහහතරලක්ෂ හැටඑක්දහස් අටසියඅනූඑකකුත් ශත පනස්හතරක (රු. 14,61,891.54) මුදල සහ 2009.07.02 වැනි දින නිවාස ණය මත හිඟ මුල් මුදල වන රුපියල් දහතුන්ලක්ෂ හතලිස්හත්දහස් දෙසිය පනස් අටකුත් ශත හතරක (රු. 13,47,258.04) මුදල මත 2009.07.03 වැනි දින සිට විකිණීමේ දිනය වෙත් වර්ෂයකට 31.75% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති යම් මුදලක් වෙතොත් එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි එම්. ඩබ්ලිව්. ත්‍රිවංක වරිත් සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව තුළ නාවල පිහිටි කොස්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජෝයි ද සිල්වා විසින් මැන සාදන ලද අංක 580 සහ 1976.02.20 දින දරන පිඹුර ප්‍රකාර ලොට් 4 නමැති බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් උතුරට : ලොට් 19 ද, නැගෙනහිරට : ලොට් 5 ද, දකුණට : ලොට් 13 ද, බස්නාහිරට : ලොට් 03 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 580 දරන පිඹුර අනුව පර්චස් පහයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 5.4) විශාල ඉඩම් කැබැල්ල ඒ මත පිහිටි ගහකොළ, පළතුරු සහ රාජගිරිය නාවල සේනානායක මාවතේ පිහිටි කලින් වරිපනම් අංක 4 ලෙස හඳුන්වන ලද වර්තමානයේ වරිපනම් අංක 124 දරන ගොඩනැගිල්ල ද සමග ය. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M1246/171 යටතේ ලියාපදිංචි කර ඇත.

තවද ඉහත කී අංක 580 දරන පිඹුරේ නිරූපිත ලොට් 19 මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

07-847/1

---

**සෙලාන් බැංකුව පීඑල්සී - මාවනැල්ල ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.21 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0480-01319764-001 සහ 0480-01519365-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. පී. අයි. ගම්ලත් විසින් දෙකම සහතික කරන ලද 2005 ජූනි මස 22 දිනැති අංක 932 සහ 2006 මැයි 19 දිනැති අංක 1252 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම මාවනැල්ල (ව්‍යාපාර ලියාපදිංචි අංක කෑ/මාව 01450) මෙසස් ඔටෝ මාට් කා සේල්ස් යන නාමය, විලාශය සහ අභිධානය යටතේ තනි ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන මාවනැල්ල පදිංචි මොහොමඩ් කජා මොහමඩ් මික්ෂාඩ් හෙවත් මොහමඩ් කජා මොහමඩ් මික්ෂාර්ඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දොලොස්ලක්ෂ හැටහත්දහස් හයසිය පනස් හතරයි ශත විසිහතර (රු. 12,67,654.24) මුදලක්, 2008 ජනවාරි මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 12,67,654.24 මුදල ද, 2008 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව

ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 932 සහ 1252 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බොඩ කෝරළේ, මැද පත්තුවේ, මාවනැල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ දැදිගම මාවත ගමේ රන්කොත්දිවෙල පිහිටි බලයලත් මිනින්දෝරු එම්. එස්. එම්. අජ්වාඩ් විසින් සාදන ලද 2004.12.31 දිනැති අංක 1430/ඒ/2004 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන වලව්වේ වත්ත නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1043/ආර් දරන සැලැස්මේ සඳහන් ලොට් 27බී ද, නැගෙනහිරට : අංක 1430/2000 දරන සැලස්මේ ලොට්1හි ඉතිරි කොටස ද, දකුණට : කොළඹ මහනුවර පාර සහ බස්නාහිරට : අංක 1430/ඒ/2004 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ද යන මායිම් තුළ පර්චස් පහයි දශම හයයි පහක් (අ. 0, රූ. 0, පර්. 5.65) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

07-820/3

---

### සෙලාන් බැංකුව පීඑල්සී - මීරිගම ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.15 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0780-01115791-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. එම්. අයි. විජයවික්‍රම විසින් දෙකම සහතික කරන ලද 2003 ජනවාරි මස 14 දිනැති අංක 1514 සහ 2005 මාර්තු 09 දිනැති අංක 2150 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම මීරිගම පදිංචි කන්දලම කංකානම්ලාගේ රෝහිත ප්‍රේමසිරි පත්මකුමාර සහ කන්දලම කංකානම්ලාගේ චන්දන කුමාර යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ තිස්හතරදහස් නවසිය අසූඅටයි ශත විසිනවයක (රු. 1,34,988.29) මුදලක්, 2006 නොවැම්බර් මස 23 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 1,34,988.29 මුදලද, 2006 නොවැම්බර් මස 24 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට 32%ක පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1514 සහ 2150 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ හාපිටිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, වේවැල්දෙණිය පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ගුණසේකර විසින් සාදන ලද 2000.01.21 දිනැති අංක 2843 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැටකෑලගහවත්ත නමැති එහි පිහිටි සියලු දේ සමග බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : එම්. ආර්. නන්දකුමාර විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, නැගෙනහිරට : කේ. කේ. සුසිලා විසින් හිමිකම් කියනු ලබන ඉඩම, එන්. සෝමලතා විසින් හිමිකම් කියනු ලබන ඉඩම් ද, දකුණට : එම්. ජී. සෝමසිරිගේ ඉඩම, එන්. ඥාණතිලක විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ පාර ද සහ බස්නාහිරට : එම්. ආර්. මහින්දගේ ඉඩම සහ එන්. ජයසිංහ විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද යන මායිම් තුළ එකී අංක 2843 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් දහහතයි දශම පහක් (අ. 0, රූ. 1, පර්. 17.5) විශාල ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 263/117හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

07-820/5

---

### සෙලාන් බැංකුව පීඑල්සී - මීගමුව ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.02.16 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0130-යු 97560-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් අයි. ටී. ගුණතිලක විසින් සියල්ල සහතික කරන ලද 2007 ජූනි මස 26 දිනැති අංක 1446, ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එම්. ගුණසිංහ විසින් සියල්ලම සහතික කරන ලද 2007 සැප්තැම්බර් මස 27 දිනැති අංක 2053, 2007 අප්‍රේල් මස 12 වැනි දිනැති අංක 1967, 2007 සැප්තැම්බර් මස 27 දිනැති අංක 2052 සහ ප්‍රසිද්ධ නොතාරිස් අයි. ටී. ගුණතිලක විසින් සහතික කරන ලද 2007 ජූනි මස 26 දිනැති අංක 1445 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම මොරටුව, මින්ලි ක්‍රියේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් මහතෙල්ගේ ගයාන් රමේෂ් පීරිස් මල්වත්තගේ දෝන චින්තා රංජනී පීරිස් සහ මහගමගේ දෝන රුවිනි බියංකා රුදිගු යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑදෙලක්ෂ හතලිස්හයදහස් දෙසිය පනස්නවයයි ශත හැටක (රු. 72,46,259.60) මුදලක්, 2009 නොවැම්බර් මස 27 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 72,46,259.60 මුදලද හැත්තෑදෙලක්ෂ හතලිස්හයදහස් දෙසීය පනස්නවයයි ශත හැටක (රු. 72,46,259.60) මුදලක්, 2009 නොවැම්බර් මස 28 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 1446, 2053, 1967, 2052 සහ 1445 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ගල්කිස්ස ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාව තුළ රාවතාවත්ත පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2000 දෙසැම්බර් 08 දිනැති පිටසන සහ 2000 අගෝස්තු මස 17 දිනැති අංක 5062ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන සිල්වියන් ලොජ් නමැති ඉඩමේ ලොට් 6 ලකුණු කළ වෙන් කරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 7 ද, දකුණට : ගාවින් මත්තෙස් සහ තවත් අයගේ දේපළ ද සහ බස්නාහිරට : ලොට් 5 සහ 1 ද යන මායිම් තුළ පර්චස් දහතුනයි දශම හතයි තුනයි නවයක් (අ. 0, රූ. 0, පර්. 13.739) ක් විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2000 දෙසැම්බර් මස 08 දිනැති අංක 5062ඒ දරන ඉහත සැලැස්මේ සඳහන් කරන ලද පිටසනක් අනුව ඉහත සඳහන් ඉඩම ඉහත සඳහන් පරිදි විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ගල්කිස්ස ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාව තුළ රාවතාවත්ත පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2000 අගෝස්තු 17 දිනැති අංක 5062ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන සිල්වියන් ලොජ් නමැති ඉඩමේ ලොට් 6 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 7 ද, දකුණට : ගාවින් මත්තෙස් සහ තවත් අයගේ දේපළ ද සහ බස්නාහිරට : ලොට් 5 සහ 1 ද යන මායිම් තුළ පර්චස් දහහතරයි දශම හතරයි අටයි පහක් (අ. 0, රූ. 0, පර්. 14.485)ක් විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 2486/192 හි ලියාපදිංචි කර ඇත.

පහත විස්තර කරනු ලබන ඉඩම උඩින් මාර්ග අයිතිය සමග.

පෙර කී රාවතාවත්ත පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2000 අගෝස්තු මස 17 වැනි දිනැති අංක 5062ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන සිල්වියන් ලොජ් නමැති ඉඩමේ ලොට් 1 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලක්දිව පර්නිෂස් විසින් හිමිකම් කියනු ලබන වරිපනම් අංක 491 දරන දේපළ ද, නැගෙනහිරට : ලොට් 9 ද, දකුණට : ලොට් 8, 7, 6, 5 සහ 2 ද සහ බස්නාහිරට : ගාලු පාර ද, යන මායිම් තුළ පර්චස් දොළහයි දශම අටයි හතයි හතක් (අ. 0, රූ. 0, පර්. 12.877) ක් විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 2940/18හි ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ගල්කිස්ස ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාව තුළ රාවතාවත්ත පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2000 අගෝස්තු 17 දිනැති අංක 5062ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගාලු පාර, වරිපනම් අංක 525/2 සහ 525/4 දරන සිල්වියන් ලොජ් නමැති ඉඩමේ ලොට් 5 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, නැගෙනහිරට : ලොට් 6 ද, දකුණට : ගාවින් මත්තෙස් සහ තවත් අයගේ දේපළ සහ බස්නාහිරට : ලොට් 4, 3 සහ 2 ද යන මායිම් තුළ පර්චස් දහතුනයි දශම දෙකයි නවයක් (අ. 0, රූ. 0, පර්. 13.29) ක් විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 3037/156 හි ලියාපදිංචි කර ඇත.

පහත විස්තර කරනු ලබන ඉඩම උඩින් මාර්ග අයිතිය සමග.

පෙර කී රාවතාවත්ත පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2000 අගෝස්තු මස 17 දිනැති අංක 5062ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන සිල්වියන් ලොජ් නමැති ඉඩමේ ලොට් 1 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලක්දිව පර්නිෂස් විසින් හිමිකම් කියනු ලබන වරිපනම් අංක 491 දරන දේපළ ද, නැගෙනහිරට : ලොට් 9 ද, දකුණට : ලොට් 8, 7, 6, 5 සහ 2 ද සහ බස්නාහිරට : ගාලු පාර ද යන මායිම් තුළ පර්චස් දොළහයි දශම අටයි හතයි හතක් (අ. 0, රූ. 0, පර්. 12.877) ක් විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 2940/18හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

07-820/6

**සෙලාන් බැංකුව පීඑල්සී - ෆස්ට් සිටි ඔෆිස් ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.10.16 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0011-යූ 90848-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් සී. සිවදාසන් විසින් සහතික කරන ලද 2007 මැයි මස 30 දිනැති අංක 572 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ 09හි පදිංචි රණවීර ආරච්චිගේ දොන් සුමිත් හේමන්ත යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහතුන්ලක්ෂ තිස්පන්දහස් තුන්සිය හැත්තෑපහයි ශත හතලිස් පහක (රු. 13,35,375.45) මුදලක්, 2008 ජූලි මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 13,35,375.45 මුදලද, 2008 අගෝස්තු මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 572 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, සියඹලාපේ පිහිටි බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සාදන ලද 2007 පෙබරවාරි මස 02 දිනැති අංක 4413ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහවත්ත නමැති ඉඩමේ ලොට් එක්ස් ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සාදන ලද 2005 අප්‍රේල් මස 02 දිනැති අංක 3218 දරන සැලැස්මේ සඳහන් ලොට් 3 ද, නැගෙනහිරට : මෙහි සඳහන් ලොට් වයි ද, දකුණට : බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපසිංහ විසින් සාදන ලද 2006 මාර්තු 11 දිනැති අංක 3730 දරන සැලැස්මේ සඳහන් ලොට් ඩී ද සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සාදන ලද 2006 ජූලි මස 02 දිනැති අංක 3940 දරන සැලැස්මේ සඳහන් ලොට් 6බී/3 ද යන මායිම් තුළ එකී අංක 4413ඒ දරන සැලැස්ම අනුව පර්චස් දෙකක් (අ. 0, රූ. 0, පර්. 22) විශාල ගොනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත කී අංක 4413ඒ දරන සැලැස්මේ සඳහන් එකී ලොට් එක්ස් පහත සවිස්තරව විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වේ.

පෙර කී සියඹලාපේ පිහිටි බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපසිංහ විසින් සාදන ලද 2005 අප්‍රේල් මස 02 දිනැති අංක 3218 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 6 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 3218 දරන සැලැස්මේ සඳහන් ලොට් 3, 4, 5, 7 සහ 9 ද, නැගෙනහිරට : එකී අංක 3218 දරන සැලැස්මේ සඳහන් ලොට් 10 ද, දකුණට : එකී අංක 687 දරන සැලැස්මේ සඳහන් ජේ. ඩබ්ලිව්. සුරේන්ද්‍රට අයිති ලොට් සී ද, සහ බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර ද යන මායිම් තුළ එකී අංක 3218 දරන සැලැස්ම අනුව රූඩ් දෙකයි පර්චස් තිස් පහක් (අ. 0, රූ. 2, පර්. 35) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 740/165හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සාදන ලද 2006 මාර්තු මස 11 දිනැති අංක 3730 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 6ඩී තුළ උඩින් යටින් සහ දිගේ මාර්ග අයිතිය සහ වෙනත් අදාළ අයිතීන් (වෙනත් අය සමග පොදුවේ) සමග

මෙහි අවම මිළ රුපියල් 18,00,000 විය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

07-820/7

---

**සෙලාන් බැංකුව පීඑල්සී - මරදාන ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.11.23 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0470එල්61407101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. ආර්. පුෂ්පාකුමාරි විසින් සහතික කරන ලද 2004 ජුනි මස 11 දිනැති අංක 360 සහ 2004.10.20 දිනැති

අංක 414 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම මනිමෙල් තුප්පහිරාලලාගේ රූපස් ඇන්ජෙලෝ ක්‍රිසන්තනිස් පෙරෝ යන අය උකස්කරු/බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිලක්ෂ හතලිස්නවදහස් හයසිය අනූතුනයි ශත දහහතක (රු. 20,49,693.17) මුදලක්, 2007 ඔක්තෝබර් මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 20,49,693.17 මුදලද, 2007 නොවැම්බර් මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 360 සහ 414 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුනේ දකුණ පයියාගල බැද්දේ මහා පයියාගල පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩී. එල්. විජේරත්න විසින් සාදන ලද 2000.01.09 දිනැති අංක 1261 දරන සැලැස්ම අනුව පල්ලියවත්ත එස්ටේට් නමැති සම්පූර්ණ බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග. ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බලයලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1962.07.04 දිනැති අංක 210 දරන සැලැස්මේ පෙන්නුම් කරනුන ලබන ලොට් 91 සහ 92හි එකතු කිරීමක් සහ අතුරු බෙදීමක් වන) ඉඩම් කොටසට මායිම්, උතුරට : වසම්බුකුල්ලයාවත්ත සහ ලොට් බී ද, නැගෙනහිරට : ලොට් බී ද, දකුණට : මෙම ඉඩමේ ලොට් 145 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 90 ද යන මායිම් තුළ පර්චස් තිහයි දශම තුනයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 30.32) විශාල ඉඩම. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එච්/265/178 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කලුතර තොටමුණේ දකුණ පයියාගල බැද්දේ මහා පයියාගල පිහිටි බලයලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1962.07.04 දිනැති අංක 210 දරන සැලැස්ම අනුව පල්ලියවත්ත එස්ටේට් නමැති ඉඩමේ ලොට් 145 ලකුණු කළ (පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 90, 91, 92, 94 සිට 99 ද, නැගෙනහිරට : ප්‍රධාන පාර ද, දකුණට : ලොට් 105 සහ වදකහවල වත්ත සහ වසම්බුකුලියාවත්ත සහ බස්නාහිරට : ලොට් 136 ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් හතරයි දශම පහක් (අ. 0. රූ. 1, පර්. 4.5) විශාල ඉඩම. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එච් 124/295 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

07-819

---

### සෙලාන් බැංකුව පීඑල්සී - ඩෙවලප්මන්ට් බැන්කිං යුනිට් ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.08 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0860-00041732-001

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ප්‍රොක්ටර් විසින් සහතික කරන ලද 2008 ඔක්තෝබර් මස 31 දිනැති අංක 352 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම රාගම පදිංචි ලුවර්ඩස් ඇන්ඩෲ බොබි ලියොන් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස්හතරලක්ෂ තිස් හත්දහස් හයසිය හැට පහයි ශත තිස් හතරක (රු. 54,37,665.34) මුදලක්, 2010 ජනවාරි මස 05 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 54,37,665.34 මුදලද, 2010 ජනවාරි මස 06 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 352 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර පී. මුතුකුමාරණ මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ නාරංගහපාලුව පිහිටි බලයලත් මිනින්දෝරු පී. එම්. කේ. පෙරේරා විසින් සාදන ලද 2004.10.02 දිනැති අංක 89/2004 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අඹගහවත්ත, කෝන්ගහවත්ත, කොස්ගහවත්ත සහ මිල්ලගහමවත්ත නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩමට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු පී. එම්. කමල් පෙරේරාගේ අංක 27/2003 දරන සැලැස්මේ ලොට් 61ඒ ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහගේ අංක එච්/009 දරන සැලැස්මේ ලොට් 16 ද, දකුණට : බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහගේ අංක එච්/009 දරන සැලැස්මේ ලොට් 62 සහ බස්නාහිරට : එච්. ඒ. පොඩිනෝනාගේ ඉඩම ද යන මායිම් තුළ එකී අංක 89/2004 දරන සැලැස්ම අනුව පර්චස් එකොලහක් (අ. 0, රූ. 0, පර්. 11) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව බී 567/167හි ලියාපදිංචි කර ඇත.

පෙර කී සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පාර සඳහා වෙන් කිරීම තුළ උඩින් සහ දිගේ මාර්ග ප්‍රවේශය සමග

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

07-818

---

**සෙලාන් බැංකුව පීඑල්සී - බණ්ඩාරවෙල ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2010.05.21 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0460-02015773-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් සුහයිරා පළීක් විසින් සහතික කරන ලද 2007 ජූනි මස 01 දිනැති අංක 623 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම බණ්ඩාරවෙල ටොව්හි ලංකා ඔටෝ ලයින් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහනවලක්‍ෂ විසිඅටදහස් තුන්සිය පනස් අටයි ශත අනූවක (රු. 19,28,358.90) මුදලක්, 2010 ජනවාරි මස 12 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 19,28,358.90 මුදලද, 2010 ජනවාරි මස 13 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි නවයයි (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 623 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ඩී. එස්. ඩිවිෂන් මහ පළාත කෝරළේ, ඕගඩඇල්ල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සෙල්ලහේවා විසින් සාදන ලද 2002 ඔක්තෝබර් මස 25 දිනැති අංක 588 දරන සැලැස්මේ සඳහන් අඹතැන්න එස්ටේට් ලොට් 3 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 2 සහ 1 ද, නැගෙනහිරට : ලොට් 1 සහ පාර ද, දකුණට : පාර මෙම ඉඩමේ ඉතිරි කොටස ද සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ලොට් 2 ද යන මායිම් තුළ පර්චස් දහඅටයි දශම හයයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 18.62) ක් විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

මෙය ඩබ්ලිව්. සෙල්ලහේවා විසින් සාදන ලද 2007 පෙබරවාරි මස 26 දිනැති අංක 1431 දරන සැලැස්ම මගින් නැවත මැන ලොට් 1 ලෙස පෙන්නුම් කර ඇති අතර එයට මායිම්, උතුරට : අංක 588 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 සහ අංක 667 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද, නැගෙනහිරට : අංක 667 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 සහ පාර ද, දකුණට : පාර මෙම ඉඩමේ ඉතිරි කොටස ද සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ අංක 588 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද පර්චස් දහඅටයි දශම හයයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 18.62)ක් විශාල ඉඩම.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

07-820/1

---

**සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකුව මගින් අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්ලිව්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 24864 හා 2007 අප්‍රේල් මස 10 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම්, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තා වූ ද ලියාපදිංචි කාර්යාලය ගම්පහ පිහිටා ඇත්තා වූ ද ලියාපදිංචි අංක N(PNS) 42143 දරන්නා වූ ද සමාගමක් වන (මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) ගිහුලංකා මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද 2010 මාර්තු මස 31 වැනි දිනට එකී ගිහුලංකා මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් එක්කෝටි විසිහය ලක්ෂ හැටහත් දහස් හයසිය හතලිස් පහකුත් ශත හැටතුනක (රු. 1,26,67,645.63) මුදලක් සහ 2010 අප්‍රේල් මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් හෝ එම ණය පහසුකමට අදාළ විය හැකි වෙනත් යම් අනුපාතිකයක් මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතු හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් එක්කෝටි විසිහය ලක්ෂ හැටහත් දහස් හයසිය හතලිස් පහකුත් ශත හැටතුනක (රු. 1,26,67,645.63) මුදලක් සහ 2010 අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් හෝ එම ණය පහසුකමට අදාළ විය හැකි වෙනත් යම් අනුපාතිකයක් මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ සහ මාර්ග අයිතිය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 24864 දරන උකස් බැඳුම්කරයේ ප්‍රඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 24864 දරන උකස් බැඳුම්කරය මගින් සමාගමේ අධ්‍යක්ෂවරයකු වන ගාමිණී වික්‍රමසේකර විසින් සමාගම සඳහා සහ වෙනුවෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය හා එහි පිහිටි සියලු දේ ඊට හිමි මාර්ග අයිතිය ද සමග කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරි ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 24864 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගම්පහ මහ නගර සභා සීමාව ඇතුළත, මැදගම ග්‍රාමයේ පිහිටි මරදගහදෙනිය නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. පී. එන්. ජයසුන්දර විසින් මැන සකස් කළ අංක 6352 හා 2007 ජනවාරි මස 10 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1A දරන ගම්පහ, කොළඹ පාර වරිපනම් අංක 3 සහ අංක 5 දරන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : මාර්ග පරිශ්‍රය ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් අංක 2 සහ ලොට් 1B ද, දකුණට : ලොට් 1B සහ කොළඹ පාර ද, බස්නාහිරට : අංක 7124 දරන පිඹුර සහ ජී. එම්. ඩී. සී. ජයවර්ධනගේ උරුමකරුවන් හිමිකම් කියන ඉඩමට ද යන මායිම් ඇතුළත පිහිටි පර්චස් දහනවයකුත් දශම පහයි හතරක් (අ. 0, රූ. 0, පර්. 19.54) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමෙන් සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දෙයින් නොබෙදූ දෙකෙන් පංගුව හෝ දෙකෙන් කොටස වේ.

මෙයට බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් මැන සකස් කළ අංක 114/2006 හා 2006 අගෝස්තු මස 13 වැනි දින දරන පිඹුරේ පෙන්නුම් කර තිබෙන මාර්ග ප්‍රයෝජනයට ගැනීමේ අයිතිය ද ඇතුළත් වේ.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

07-807/2

**සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්ලිව්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 23225 හා 2005 ඔක්තෝබර් මස 19 දින ද, අංක 24279 හා 2006 සැප්තැම්බර් 27 දින ද, අංක 24768, 24769 සහ 24770 සහ 2007 මාර්තු මස 06 දින ද දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම්, යක්කල සුනිල් ධර්මසිරි වීරප්පෙරුම යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2010 මාර්තු මස 31 වැනි දිනට එකී සුනිල් ධර්මසිරි වීරප්පෙරුම යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් හැත්තෑ හතරලක්ෂ අනූහතර දහස් දෙසිය පනස් හයකුත් ශත දහ හතරක (රු. 74,94,256.14) මුදලක් සහ 2010 අප්‍රේල් මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැට දෙලක්ෂයක් (රු. 62,00,000) සඳහා වර්ෂයකට සියයට විසිනවයකුත් දශම පහක් (29.5%) බැගින් පොළිය ද, රුපියල් දහඅට ලක්ෂ හැත්තෑතුන් දහස් නවසියයකුත් ශත හැත්තෑ තුනක (රු. 18,73,900.73) මුදලක් සහ 2010 අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් හෝ මෙම ණය පහසුකමට අදාළ විය හැකි වෙනත් යම් අනුපාතිකයක් මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතු හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් හැත්තෑ හතරලක්ෂ අනූහතර දහස් දෙසිය පනස් හයකුත් ශත දහ හතරක (රු. 74,94,256.14) මුදලක් සහ 2010 අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැට දෙලක්ෂයක් (රු. 62,00,000) සඳහා වර්ෂයකට සියයට විසිනවයකුත් දශම පහක් (29.5%) බැගින් පොළිය ද, රුපියල් දහඅට ලක්ෂ හැත්තෑ තුන්දහස් නවසියකුත් ශත හැත්තෑ තුනක (රු. 18,73,900.73) මුදලක් සහ 2010 අප්‍රේල් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් හෝ මෙම ණය පහසුකමට අදාළ විය හැකි වෙනත් යම් අනුපාතිකයක් මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ ඊට හිමි මාර්ග අයිතිය හා ව්‍යාපාරික බඩු තොග විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 23225, 24279, 24768, 24769 හා 24770 යන උකස් බැඳුම්කරවල ප්‍රඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 23225, 24279, 24768, 24769 හා 24770 දරන උකස් බැඳුම්කර මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය හා ඊට හිමි මාර්ග අයිතිය හා ව්‍යාපාරික බඩුතොග කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරි ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 24279 සහ 24770 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව ඇතුළත යක්කල-අලුත්ගම පිහිටි, ඇඹිල්ලගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර විසින් මැන සකස් කළ අංක 925/2003 හා 2003.12.17 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් බී ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : බලයලත් මිනින්දෝරු එස්. ඒ. වී. පෙරේරා විසින් මැන සකස් කළ අංක 137B/88 දරන පිඹුරේ ලොට් ඒ1, බී1, සහ නුවර පාරේ සිට නිවෙස්වලට යන අඩි 12ක් පළල පාර ද, නැගෙනහිරට : නුවර පාරේ සිට නිවෙස්වලට යන පාර ද, දකුණට : කොළඹ-මහනුවර ප්‍රධාන පාර සහ අංක 363/2003 දරන පිඹුරේ ලොට් 2හි ඉතිරි කොටස ද, බස්නාහිරට : අංක 363/2003 දරන පිඹුරේ ලොට් 2හි ඉතිරි කොටස ද, යන මායිම්, ඇතුළත ඉහත කී අංක 925/2003 දරන පිඹුරේ ප්‍රකාර පර්චස් අටකුත් දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 8.40) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් දේ.

මෙයට ඉහත සඳහන් අංක 925/2003 දරන පිඹුරේ දැක්වෙන පාර පාවිච්චි කිරීමේ අයිතිවාසිකම ද ඇතුළත් වේ.

**අංක 23225 සහ 24769 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ මහ නගර සභා බල සීමාව ඇතුළත යක්කල පිහිටි, ඇඹිල්ලගහවත්ත නමැති ඉඩමේ නුවර පාර වරිපනම් අංක 218 දරන බිම් කට්ටිය වූ ඉඩමේ, බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර විසින් මැන සකස් කළ අංක 411/2005 හා 2005.07.16 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 2 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : අංක 411/2005 දරන පිඹුරේ ලොට් අංක 1 ද, නැගෙනහිරට : අංක 411/2005 දරන පිඹුරේ ලොට් අංක 1 ද, දකුණට : කොළඹ-මහනුවර මහ පාර සහ ජී. කේ. එම්. පතිරණ හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : පී. කේ. එම්. පතිරණ හිමිකම් කියන ඉඩම ද යන මායිම් ඇතුළත පර්චස් දහතුනකුත් දශම දෙකයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 13.22) නොහොත් හෙක්ටෙයාර් 0.0334ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ වෙනත් සියලු දේ.

**අංක 24768 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද චන්කම් විස්තරය**

ශ්‍රී ලංකා ජනරජයේ, බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, යක්කල නුවර පාර, අංක 140 දරන ස්ථානයේ ජිනදාස මෝටර්ස් පරිශ්‍රය තුළ සහ මත දැනට තිබෙන, වීල් ලෝඩර්, රෝඩ් රෝලර්, ජෙනරේටර් ඇතුළුව එම පරිශ්‍රය තුළ හා මත තිබෙන හෝ ගබඩාකර ඇති වෙනත් සියලු අයිතිම හා කවර වූ හෝ සෑම ආකාරයකම හා සෑම විස්තරයකටම අයත් වෙනත් සියලු චංචල දේපළ.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

07-807/3

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංක : එස්-6/30750/ආර්ඩී1/172, එස්-6/35749/ආර්ඩී1/195.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003.03.27 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. වීරසේකර විසින් සහතික කරන ලද 1997.05.05 සහ 1999.03.29 දින හා අංක 2002 සහ 2973 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, පානදුර පදිංචි ඇල්ලේතොට ආරච්චිගේ ප්‍රියන්ත පුෂ්පකුමාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2003.02.28 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ පනස් හතර දහස් පන්සිය අනූඑකයි ශත විසිදෙක (රු. 4,54,591.22)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2002 සහ 2973 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් අනූ දෙකයි ශත හැට හත (රු. 92.67) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙහි බලයලත් වෙන්දේසිකාර එච්. ජී. පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

**උපලේඛනය**

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ කෙසෙල්වත්ත උප කාර්යාලයේ හිරණ සීමාව තුළ කජුගහඕවිට හිරනාවල ඒ කොටස සහ බටලන්දෙවත්ත (බී) මිල්ලගහවත්ත (ඩී), (ඊ) සහ (එෆ්) බටලන්දෙවත්ත කොටසක් යන ඉඩම්මලට (1994.01.13 සහ 1994.02.11 දිනයන්හි සකස් කරන ලද අංක 519 දරන පිඹුරේ කැබලි අංක 1, 2, 4, 4බී සහ 4සී යන කැබලි ඒකාබද්ධ කොට 1994.09.10 සහ 1994.10.11 දිනයන්හි වයි. පී. ද සිල්වා බලයලත් මිනින්දෝරු තැන විසින් නැවත මැන සකස් කරන ලද පිඹුරට අනුව) 1994.02.10 සහ 1994.02.11 සහ 1994.09.10 සහ 1994.01.11 දිනයන්හි බලයලත් මිනින්දෝරු වයි. පී. ද සිල්වා විසින් බෙදා වෙන් කරන සකසන ලද අංක 571ඒ දරන පිඹුරේ කැබලි අංක 54 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10ක් වූ බිම් කොටස.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස අංක 11120 දරන පිඹුරේ කැබලි අංක 58 සහ 70 සහ කැබලි අංක 106, අංක 307/217 යටතේ ලියාපදිංචි වී ඇති සහ අංක 517ඒ පිඹුරේ කැබලි අංක 118, 53 (ආර්6) 50, (ආර්3) 65 සහ 106 සහිත කොටස් වේ.

අයි. විමලසේන,
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2010 ජූලි මස 15 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

07-954/2

### පැන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - මීගමුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : එස්. ජී. එස්. පෙරේරා සහ කේ. ජී. ආර්. ප්‍රනාන්දු.

පැන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.30 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, සිංහල ගුරුනනාන්සේලාගේ සුදාන් පෙරේරා සහ කාරියකරවනගේ ජෝර්ජ් රොහාන් ප්‍රනාන්දු බන්ධනදායියන් වශයෙන් ද, කාරියකරවනගේ ජෝර්ජ් රොහාන් ප්‍රනාන්දු උකස්කරු වශයෙන් ද, කලින් පැන් ඒෂිය බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒසියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. ගොඩ්ෆ්‍රි කුරේ විසින් ලියා සහතික කරන ලද අංක 5960 සහ 2008.03.25 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දිනය තෙක් 2010.05.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් හතලිස් එක්ලක්ෂ තිස්එක් දහස් හයසිය පනස් එකයි ශත පනස් දෙකක (රු. 41,31,651.52)ක මුදල සහ 2010.05.17 වැනි දින සිට රුපියල් තිස්නව ලක්ෂ විසිදහස් නමසිය හතලිස් හතයි ශත අසූ දෙකක (රු. 39,20,947.82) ක මුදල මත වර්ෂයකට සියයට විස්ස (20%) බැගින් පොලිය ද, 2010.06.01 වැනි දින සිට රුපියල් හැත්තෑ නවදහස් පනස් දෙකයි ශත දහඅට (රු. 79,052.18) ක මුදල මත වර්ෂයකට සියයට විසි හතර (24%) බැගින් පොලිය ද, පැන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකු යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත් :

එකී අංක 5960 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් හතලිස්එක් ලක්ෂ තිස්එක් දහස් හයසිය පනස් එකයි ශත පනස් දෙකක (රු. 41,31,651.52) ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද, ගාස්තු ද, අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද, අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස් කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, බෙල්මන්ට් වීදිය අංක 9හි පිහිටි එම්. එස්. ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකරු ශ්‍රියාණි මනම්පේරි වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙස ය.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ මීගමුව නගර සභා සීමාවේ තුන්වන කුරණ මංගල මාවත අංක 56/2 කහට ගහවත්ත ඉඩමෙන් බෙදී වෙන්වුණු කොටසට ඉහත කී ආර්. අයි. ප්‍රනාන්දු මිනින්දෝරු තැන 1990.04.21 වැනි දින මැන සෑදූ 3039 දරන සැලැස්ම ප්‍රකාර ලොට් 2 දරන කොටසට මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් 1 දරන කොටස ද, නැගෙනහිරට : ඒ. මාකස් ප්‍රනාන්දුට අයත් ඉඩම ද, දකුණට : එකී පිඹුරේ ලොට් 3 දරන කොටස ද, බස්නාහිරට : එකී පිඹුරේ අඩි දහයක් පළල පාරක් වෙනුවෙන් අත්හල ලොට් 4 දරන කොටස ද, මායිම් වූ පර්චස් දොළසක් විශාල (අ. 0, රූ. 0, පර්. 12) ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු ආදී සියල්ල සහ එකී අංක 3039 දරන සැලැස්මේ ලොට් 4 (අඩි 10ක් පළල පාරක් සඳහා වෙන් කළ) මතින් වන සම්පූර්ණ මාර්ග අයිතිය ද සමගින් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සුදත් නැලිගම,
සහකාර කළමණාකරු-ණය අයකර ගැනීම්.

07-1006/9

---

### පැන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - නුවර ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : දොන් චමිල උදාර අයිලප්පෙරුම.

පැන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.30 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, දොන් චමිල උදාර අයිලප්පෙරුම විසින් කලින් පැන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට නුවර ප්‍රසිද්ධ නොතාරිස් ජී. එස්. බී. ඇහැලියගොඩ විසින් ලියා සහතික කරන ලද අංක 3041 සහ 2006.11.22 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 3041 දරන උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දිනය තෙක් 2010.05.05 දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් නවලක්ෂ තුන්දහස් තුන්සිය හැත්තෑ තුනයි ශත තිස් දෙකක (රු. 9,03,373.32) ක මුදල සහ 2010.05.01 වැනි දින සිට රුපියල් හත්ලක්ෂ පනස්දහස (රු. 7,50,000) මුදල මත වර්ෂයකට සියයට විසි හත (27%) ක් බැගින් පොලිය ද, රුපියල් හත්ලක්ෂ පනස්දහස (රු. 7,50,000) සීමාව ඉක්මවන මුදල සඳහා සියයට විසි නවය (29%) බැගින් පොලිය ද, පැන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත් :

එකී අංක 3041 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් නවලක්ෂ තුන් දහස් තුන්සිය හැත්තෑ තුනයි ශත තිස් දෙකක (රු. 9,03,373.32) ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද, ගාස්තු ද අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද, අයකර

ගැනීම සඳහා මෙහි උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස් කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ, අංක 134හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙස ය.

### උපලේඛනය

(1) මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, වගපනහ උතුරු කෝරළයේ, පල්ලේසිය පත්තුවේ, නයාකුඹුර ඇතින්නවැටිච්චිහේන්යාය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. රන්වාගොඩ විසින් මැන සාදා මාතලේ දිසා අධිකරණයේ අංක P/1515 දරන නඩුවට ගොණු කරන ලද අංක 709A සහ 1993 නොවැම්බර් මස 12 වැනි දින දරන සැලැස්මේ නිරූපිත ලොට් අංක 1 දරන අක්කර එකොලහයි රූඩ් 1යි පර්චස් 8ක් (අ. 11, රූ. 1, පර්. 8) විශාල ඉඩමට මායිම්, උතුරට : ලොට් 7, නැගෙනහිරට : ජයසුන්දර (දොරේ) ට අයත් දිවුල් ගහවත්ත සහ ලොට් 5 සහ කරුණාරත්න විසින් අයිතිවාසිකම් කියන දිවුල්ගහ වත්ත සහ කම්බි වැට සහ ලොට් 4 ද, දකුණට : එකී සැලැස්මේ ලොට් 4 සහ ලොට් 8 (අඩි 10ක් පළල පාර) සහ බස්නාහිරට : ලොට් 8 (අඩි 10ක් පළල පාර) සහ එකී සැලැස්මේ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද සමග වේ. (ලොට් 8 (අඩි 10ක් පළල පාර) මතින් වන මාර්ග අයිතිවාසිකම් ද ඇතුලුව) මෙය මාතලේ ඉඩම් ලි. ප. කාර්යාලයේ D509/109 යටතේ ලියාපදිංචි කර ඇත.

| 115 | insulation material including glasswool pads, aluminum cladding sheets, fixing, screws etc. (ග්ලාස්වූල් පෑඩ්, ඇලුමිනියම් ක්ලැඩින් තහඩු, සවිකිරීම් ස්කෘ යනාදිය ඇතුළු ඉන්සුලේෂන් ද්‍රව්‍ය) | 1 ලොට් |

ඉහතකී යන්ත්‍රෝපකරණ එකී පරිශ්‍රයන් වෙත ගෙනෙනු ලැබ ස්ථාපිත කරනු ලබන අතර එකී යන්ත්‍රෝපකරණ හෝ ඒවායින් ඕනෑම කොටසක් හෝ කොටස් කීපයක් හෝ චංචල යන්ත්‍රෝපකරණ වෙනුවට කලින් කලට වෙනත් ඒවා යොදනු ලැබිය හැකිය.

උකස් බැඳුම්කර අංක 1860/එස්බීඑල්/සීආර් මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.

### දෙවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ මීගමුව සහ කොළඹ යන දිස්ත්‍රික්කවල පිළිවෙලින් නිට්ටඹුව, වතුපිටිවල ආයෝජන මණ්ඩල කලාපයේ කර්මාන්තශාලා පරිශ්‍රයන් හි හා ඒ තුළ සහ කොළඹ 15, මහවත්ත පාර, මනීෂා (ප්‍රයිවට්) ලිමිටඩ් හි පවතින සියලුම සහ එක් එක් තොග - වෙළඳ, ද්‍රව්‍යයන්, නිමි හා නොනිමි භාණ්ඩ, යන්ත්‍රෝපකරණ, (Crude Palm Oil/RBD Palmoil),ක්‍රෑඩ් පාම් ඔයිල්/ආර්බීඩී පාම් ඔයිල්, (Sesame Seed Oil/Other Edible Oil), සෙසමී සීඩ් ඔයිල්/වෙනත් ආහාරයට ගත හැකි තෙල්, විටමින් A සහ D දියරය, Antioxidant (ඇන්ටි ඔක්සිඩන්ට්), Tbhq, (Profiled Electrolytic Tin Plates/Newman Caps/Handles), ප්‍රොෆයිල්ඩ් ඉලෙක්ට්‍රෝලික්ටික් ටින් ප්ලේට්ස්/නිව්මෑන් කැප්/හැඬල්, (Tin Jointing Adhesive Solution) ටින් ජොයින්ටින් ඇලෙනසුළු දියරය, (Bleaching Earth) බ්ලීචින් අර්ත්, (Phosphoric Acid), ෆොස්ෆරික් ඇසිඩ්, (Citric Acid), සිට්රික් ඇසිඩ්, (Filter Aid Powder), ෆිල්ටර් ඒඩ් පවුඩර්, (Nickel Oleate Catalyst), නිකල් ඔලියේට් කැටලිස්ට්, (Mono Glycerides/ Diglycerides/Emulsifying Agents), මොනෝ ග්ලිසරයිඩ්ස්/ ඩයිග්ලිසරයිඩ්ස්/ ඉමල්සිෆයින් ඒජන්ට්ස්, (Vanspati Ghee (Vegetable Fat) Palm Fatty Acid Distillate), වනස්පටි ගිතෙල් (එළවලු මේද) පාම් ෆැටි ඇසිඩ් ඩිස්ටිලේට්, (Spent Nickel Oleate) ස්පෙන්ට් නිකල් ඕලියේට් සහ අනෙකුත් සියලුම ද්‍රව්‍ය සහ ද්‍රව්‍ය එක් එක් කොටස් සහ සියලුම කොටස් අඩංගු උපකරණ කොටස් සහ අනෙකුත් දේ ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ අනෙකුත් දේ සහ සෑම ආකාරයේ සහ සෑම අයුරින් විස්තර කොට ඇති සෑම සියලු දෙයක් (මින්මතු වෙළඳ තොග, ද්‍රව්‍ය, බන්ධනදායිගේ නිමි සහ නොනිමි භාණ්ඩ වශයෙන් පොදුවේ හඳුන්වනු ලන) වන චංචල දේපළ එකී දිස්ත්‍රික්කවල කරගෙන යන ව්‍යාපාරයේ දැන් හෝ ඕනෑම අවස්ථාවකදී සහ කලින් කලට මින් මතු බන්ධනදායිගේ ගෝ ඩවුන් ගබඩා සහ පරිශ්‍රයන් හි හා ඒවා තුළ ඇති හා එකී බන්ධනදායිගේ එකී පරිශ්‍රයන් හි හා ඒවා තුළ ඇති වෙළඳ තොග, ද්‍රව්‍යයන්, නිමි හා නොනිමි භාණ්ඩ හා බඩුමුට්ටු සහ මේ කාලය තුළ මින් මතු සෑම අවස්ථාවකදීම කලින් කලට සෑම අයුරක හා සෑම අයුරකින් විස්තර කොට ඇති වෙනත් චංචල දේපළ හා බඩුමුට්ටු හා බන්ධනදායී ඕනෑම අවස්ථාවක හෝ කලින් කලට මින්මතු මෙම භාණ්ඩ රැගෙන යා හැකි හෝ තබා තැබිය හැකි වෙනත් ස්ථානයක් හෝ ස්ථානවල වෙළඳාම් කරනු ලබන හෝ ගනුදෙනු කරනු ලබන හෝ ගබඩා කරනු ලබන බන්ධනදායිගේ වෙළඳ තොග, ද්‍රව්‍ය, නිමි හා නොනිමි භාණ්ඩ සහ බඩුමුට්ටු සහ වෙනත් චංචල දේපළ.

II

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හා මහ නගර සභා සීමාවන් තුළ, කොළඹ වරායේ ගුදම්වල හා වාප්පුවල හා ඒවා තුළ ඇති (බන්ධනදායි ගේ වරාය ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් මින් මතු පොදුවේ හඳුන්වනු ලබන සියලුම දෑ) ගෘහ භාණ්ඩ අඩංගු සෑම ආකාරයකම සියලුම හා එක් එක් ද්‍රව්‍ය, උපකරණ සහ අනෙකුත් සියළුම භාණ්ඩ.

III

බස්නාහිර පළාතේ මීගමුව සහ කොළඹ දිස්ත්‍රික්ක තුළ පිළිවෙලින් නිට්ටඹුව, වතුපිටිවල ආයෝජන මණ්ඩල කලාපයේ කර්මාන්තශාලා පරිශ්‍රයේ සහ කොළඹ 15, මහවත්ත පාර, මනීෂා (ප්‍රයිවට්) ලිමිටඩ් හි ගබඩාවන් හි හා ගුදම් හි හා ඒවා තුළ පවතින (බන්ධනදායිගේ තේ සහ ඇසුරුම් ද්‍රව්‍ය යනුවෙන් මින් මතු පොදුවේ හඳුන්වනු ලබන සියලුම දෑ) ගෘහ භාණ්ඩ අඩංගු සෑම ආකාරයකම සියලුම හා එක් එක් ද්‍රව්‍ය, යන්ත්‍ර, උපකරණ සහ අනෙකුත් සියළුම භාණ්ඩ.

උකස් බැඳුම්කර අංක 1,859/එස්බීඑල්/සීආර් සහ 6930 2190 3288 මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

07-1007/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

බී. බී. ඉන්ද්‍රරත්න සහ ජී.එම්.යූ. වික්‍රමසිංහ.
ගිණුම් අංක : 0007 5009 3914.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010.05.31 වෙනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක. පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එම්.එන්.ජී. රත්නායක යන අය විසින් ලියා සහතික කරන ලද 2005 දෙසැම්බර් 21 දාතම හා අංක. 114 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛණයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා හා පරිශ්‍රයන් ඇපයට තබගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බෙන්තොටගේ බන්දුල ඉන්ද්‍රරත්න සහ ගජසිංහ මුදියන්සේලාගේ උපාලි වික්‍රමසිංහ යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී ගජසිංහ මුදියන්සේලාගේ උපාලි වික්‍රමසිංහ උකස්කරු වශයෙන් පැහැරහැර ඇති හෙයින්ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අට ලක්ෂ හතලිස් නම දහස් එකසිය තිස් නමයයි ශත තිස් අටක (රු.849,139.38) මුදලක් 2009 මාර්තු 31 වෙනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් අට ලක්ෂ හතලිස් නම දහස් එකසිය තිස් නමයයි ශත තිස් අටක (රු.849,139.38) මුදලද 2009 අප්‍රේල් 01 දින සිට අංක 114 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් ලක්ෂ පනස් දහසක (රු.350,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතයි දශම පහයි (17.5%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වේතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 114 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නාලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**ඉහත කී උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර කෝරළේ පල්ලේගම්පහ පත්තුවේ පාතදුම්බර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දොරගමුව ග්‍රාමයේ පිහිටි නිල්ලෙහීනෙහේන දැන් උද්‍යානය සහ නිල්ලෙහීනේ හපුගහමුදුනේහේන යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී.බී. අත්තනායක යන විසින් සාදන ලද 2005 අගෝස්තු 29 දාතම හා අංක 256/2005 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1113 දරන පිඹුරේ ලොට් 2, නැගෙනහිරට : පල්ලේගම සිට දොරගමුව දක්වා ගම්සභා පාර දකුණට සහ නිරිතට : වටදෙණියේගෙදරහේන වෙන් කරන මාල ඇල යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විසි අටයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 2, පර්. 28.25) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 256/2005 දරන පිඹුරට අනුවයි.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :-

එකී දොරගමුව ග්‍රාමයේ පිහිටි නිල්ලෙහීනෙහේන දැන් උද්‍යානය සහ නිල්ලෙහීනේ හපුගහමුදුනේහේන කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සී. පලමකුම්බුරා යන විසින් සාදන ලද 1982 ජනවාරි 02 දාතම හා අංක 1113 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 1113 දරන පිඹුරේ ලොට් 2, නැගෙනහිරට : පල්ලේගම සිට දොරගමුව දක්වා ගම්සභා පාර, දකුණට : සහ නිරිතට : වටදෙණියේගෙදරහේන වෙන් කරන මාල ඇල යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විසි අටයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 2, පර්. 28.25) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක. 1113 දරණ පිඹුරට අනුව වෙළුම/පත්‍රුරුව E 790/25 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්

07- 1012/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

වයි.එම්.ආර්.අබේරත්න.
ගිණුම් අංක : 0038 5000 0254.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008.08.28 වෙනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :

සම්පත් බැංකුව පීඑල්සී (සමාගම් අංක පීකිව් 144 යටතේ ලියාපදිංචි කොට ඇත.) නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ.ජේ. බණ්ඩාර විසින් ලියා සහතික කරන ලද 2007 අගෝස්තු 07 දාතම හා අංක 1462 දරන හා පොළොන්නරුව එස්. රණතුංග විසින් ලියා සහතික කරන ලද 2006 ජනවාරි 02 දාතම හා අංක 517 දරන හා 2005 අගෝස්තු 24 දාතම හා අංක 428 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පොළොන්නරුව ආරෝග්‍යශාලා හන්දිය ‘‘රෝහණ ඉලෙක්ට්‍රොනික්ස් ’’, අංක 6, හි පදිංචි යාපා මුදියන්සේලාගේ රෝහිත අබේරත්න විසින් බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් විසිනව ලක්ෂ අනූදහස් හැත්තෑ තුනයි ශත හැත්තෑ හතරක් (රු.29,90,073.74) 2008 මැයි 07 වෙනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් විසිනව ලක්ෂ අනූදහස් හැත්තෑ තුනයි ශත හැත්තෑ හතරක් (රු.29,90,073.74) මුදලද 2008 මැයි 08 දින සිට අංක 428, 517 සහ 1462 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර ලක්ෂ අනූතුන් දහස් දෙසීය හතලිස් නමයයි ශත හැට එකක් (රු. 4,93,249.61) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතයි දශම පහ (17.5%) බැගින් වූ පොලියද, රුපියල් දහනම ලක්ෂ විසි අට දහස් තුන්සිය තිස් අටයි ශත විසි හතරක (රු. 19,28,338.24) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනයි දශම පහ (13.5%) බැගින් වූ පොලියද, රුපියල් දෙලක්ෂ හතලිස් හය දහස් නමසිය හයයි ශත පනස් හතක (රු.2,46,906.57) ක මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින්වූ පොලියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 428, 517 සහ 1462 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැද පත්තුව තමන්කඩුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ තෝපා වැව ග්‍රාමයේ පිහිටි 'මිනිපිටියෙ මුකලාන සහ උරන්නේකැලේ' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්.බී. අබේකෝන් යන විසින් සාදන ලද 2004 මැයි 19 දාතම හා අංක. ජී. 2004-10 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 12 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 13 නැගෙනහිරට : ලොට් 14 දකුණට : අංක 92/527 පිඹුරේ ලොට් 15 හා 16 සහ බස්නාහිරට : ලොට් 11 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) හෝ හෙක්ටයාර 0.0253ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාගී අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් වෙළුම/පිටුව ඒ 29/279 හි පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක. ජී 2004-10 යන එකී පිඹුරේ නිරූපිත ලොට් 13 සහ 21 වශයෙන් ලකුණුකොට ඇති මාගී වෙන්කිරීම් මතින් හා ඒවා දිගේ මාර්ග අයිතියද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්

07- 1012/3

---

### සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ආර්.දන්දෙණිය සහ ඩබ්ලිව්.ඒ.කේ. වික්‍රමසිංහ.
ගිණුම් අංක : 1007 5338 0506.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010.05.31 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක. පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්.ටී.කේ. බීබැද්ද. යන අය විසින් ලියා සහතික කරන ලද 2008 අප්‍රේල් 01 දාතම හා අංක 1183 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රංජිත් දන්දෙණිය සහ වික්‍රසිංහ ආරච්චිගේ කුසුමාවතී වික්‍රමසිංහ යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී රංජිත් දන්දෙණිය උකස්කරු වශයෙන් පැහැරහැර ඇති හෙයින්ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් විසි හය ලක්ෂ තිස් හතර දහස් හයසිය දහ හතරයි ශත අසූ හයක (රු.26,34,614.86) මුදලක් 2009 දෙසැම්බර් 20 වෙනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් විසි හය ලක්ෂ තිස් හතර දහස් හයසිය දහ හතරයි ශත අසූ හයක (රු. 26,34,614.86) මුදලද 2009 දෙසැම්බර් 21 දින සිට අංක 1183 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි දෙලක්ෂ අනූ අට දහස් දෙසීය දහ අටයි ශත හැට පහක (රු. 22,98,218.65) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1183 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**ඉහත කී උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ දුම්බර පළාත උඩුගම්පහ කෝරළේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුල අතරගල් පල්ලේගම කෝවිලකැලේ ගම්මැද්දේ පිහිටි (බලයලත් මානක තැන කුසුමන් රූපසිංහ යන අය විසින් සාදන ලද 1998 ජනවාරි 04 දින උප බෙදුම) 1993 නොවැම්බර් 23 දාතම හා අංක 269 දරන ලොට් 1B හී උපබෙදුමක් සහ නැවත මිනුමක් වන මල්පනහේන දැන් වත්ත යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඊ.වී. සිරිසුමන යන අය විසින් සාදන ලද 2005 ඔක්තෝබර් 15 දාතම හා අංක 6332 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට, ඊසානට සහ නැගෙනහිරට : පන්සල සිට මැනික්හින්න, තෙල්දෙණිය දක්වා පාර දකුණට : ලොට් 1බී සහ බස්නාහිරට : අංක 269 දරණ පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයන් රූඩ් එකයි පර්චස් හයයි දශම දෙකයි හතක් (අ. 0, රූ. 1, පර්. 6.27) හෝ හෙක්ටයාර 0.1170 විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාගී අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 6322 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව 634/248 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අතරගල්ල පිහිටි (බලයලත් මානක තැන කුසුමන් රූපසිංහ යන විසින් සාදන ලද 1998 ජනවාරි 04 දින උපබෙදුම) 1993 නොවැම්බර් 23 දාතම හා අංක 269 දරන පිඹුරේ ලොට් 1B හි උපබෙදුමක් සහ නැවත මිනුමක් වන මල්පනහේන දැන් වත්ත යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඊ.වී. සිරිසුමන යන අය විසින් සාදන ලද 2005 ඔක්තෝබර් 15 දාතම හා අංක 6332 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1ඒ නැගෙනහිරට : පන්සල සිට පාර දකුණට : මැනික්හින්න සිට තෙල්දෙණිය දක්වා පාර සහ බස්නාහිරට : අංක 269 දරන පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම බිංදුවයි පහක් (අ. 0, රූ. 0, පර්. 6.05) හෝ හෙක්ටයාර 0.0153 විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාගී අයිතීන්ද වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 6322 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව 634/249 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07- 1012/1

---

**ලංකා බැංකුව**

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම**

2010.03.18 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

1. මහජන නොතාරිස් ඩබ්. ඒ. එස්. සී. මැතිව් විසින් සහතික කරන ලද 1995.03.15 දිනැති අංක 1276 දරන බැඳුම්කරය සහ මහජන නොතාරිස් ඊ. කේ. එච්. එම්. කරුණාතිලක විසින් සහිතක කරන ලද 2006.11.06 දිනැති අංක 280 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2010.02.01 වෙනි දින තෙක් පොලිය හා වෙනත් ගාස්තුද, ණය මත රුපියල් දාහතර ලක්ෂ දසදහස් හයසිය අනූපහයි ශත හතලිස් පහක් (රු.14,10,695.45) සහ ස්ථිර අයිරාව මත රුපියල් පන්ලක්ෂ තිස්පන් දහස් හත්සිය අනූතුනයි ශත පනස් තුනක (රු.5,35,793.53) ක මුදලක් සමග ණය මත රුපියල් නවලක්ෂ හයදහස් එකසිය පනහක (රු.9,06,150) මුදලක් මත සහ ස්ථිර අයිරා මුදල රුපියල් දෙලක්ෂ හැත්තෑදහස් (රු.2,70,000) (ඉක්මවා ගිය මුදල රුපියල් එක්ලක්ෂ තිස්එක් දහස් හයසිය හැටඅටයි ශත අනූහතක (රු. 1,31,668.97) ඇතුළත් කොට නොමැත) මත පිළිවෙලින් වසරකට සියයට දහඅට (18%) බැගින් සහ සියයට පහළොව (15%) බැගින් 2010.02.02 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පොලියද, අකුරුගොඩ ගමගේ හසිත විරාජ් මහතාගෙන් අයවිය යුතුය ඇත.

2. එකී අංක 1276 සහ 280 දරන බැඳුම්කර මත ඉහත කී ණය මත අයවිය යුතු එකී රුපියල් දාහතර ලක්ෂ දසදහස් හයසිය අනූපහයි ශත හතලිස් පහක (රු. 14,10,695.45) මුදල සමග ස්ථිර අයිරාව මත රුපියල් පන්ලක්ෂ තිස්පන් දහස් හත්සිය අනූතුනයි ශත පනස් තුනක (රු. 5,35,793.53) මුදලක් සමග 2010.02.02 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥාපනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පල කිරීමට ලංකා බැංකුව, පිළියන්දල ශාඛාවේ කළමනාකරුට මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ තලවතුහේන්පිට උතුර පිහිටි, සුදර්ශනාරාම පාරේ, වරිපනම් අංක 84 දරන තලවතුහේන්පිට උතුර දවටගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. සී. එම්. එස්. විමලරත්න විසින් සාදන ලද 1994 ජුනි 26 දිනැති අංක 158/1994 දරන පිඹුරෙහි ලොට් 4 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 4 උතුරට ලොට් 3 ද, නැගෙනහිරට වන්නිඅප්පුආරච්චිගේ එම ඉඩමේ කොටසක්ද, දකුණට රෝහල් පාරද, බස්නාහිරට පිඹුරු අංක 1465A හි ලොට් 8 ද, මායිම්ව අංක 158/1994 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, එහි ඇති සහ වැවෙන ගහකොල, වැව්ලි, ගොඩනැගිලිද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි C541/116 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙයට එකී තලවතුහේන්පිට උතුර පිහිටි දෙවටගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. ඒ. එස්. පිලිපෙයා විසින් සාදන ලද 1961 ඔක්තෝබර් 28 දිනැති අංක 1465 දරන පිඹුරෙහි ලොට් 8 ලෙස දක්වා නිරූපනය කර ඇති, උතුරට : ලොට් 1සහ 7 ද, නැගෙනහිරටː ලොට් 2 සහ 3 ද, දකුණට : පාර ද, බස්නාහිරට : එකී අංක 1465 දරන පිඹුරට අනුව මායිම්වූ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C541/118 හි ලියාපදිංචි කර ඇති බිම් කැබැල්ල මතින් පාරේ අයිතිය ද ඇත.

අයි. ගුණරත්න,
කළමනාකරු.

ලංකා බැංකුව,
පිළියන්දල ශාඛාව.

07-961

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116 දරන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ණය ගිණුම් අංකය : 416759
පත්තිනියා හකුරු සුමිත් ජීවානන්ද

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 නොවැම්බර් මස 27 වන දින පවත්වන ලද රැස්වීමේ දී විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරන ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ.සී.විජේනාරායන විසින් කලින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් සහ වර්තමානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 2363 සහ 2007 දෙසැම්බර් මස 28 දින දරන බැඳුම්කරය මත ගෙවීම් එහි බන්ධනදායි වන ඉහත කී පත්තිනියා හකුරු සුමිත් ජීවානන්ද යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, ඉහත කී බැඳුම්කරය මත 2009 ඔක්තෝබර් මස 12 වන දිනට රුපියල් තිස්දෙලක්ෂ අසූහත්දහස් හයසියඅසූඅටකුත් ශත දහසයක (රු. 32,87,688.16) මුදලක් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත වර්තමානයේදී ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද, ඉහත කී රුපියල් තිස්දෙලක්ෂ අසූහත්දහස් හයසියඅසූඅටකුත් ශත දහසයක (රු. 32,87,688.16) මුදල සහ 2009 ඔක්තෝබර් මස 13 වන දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් විසිඅටලක්ෂ දහසයදහස් තුන්සියය (රු. 28,16,300) මුදල මත වර්ෂයකට 19% බැගින් පොළිය ද ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති යම් වෙනත් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2363 දරන බැඳුම්කරය මඟින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, අළුත් කඩේ විදියේ අංක 99 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු වන එල්.බී.සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වලල්ලාවිට කෝරළේ බෙන්තොට ඇල්ල තනබද්දේගම ගමේ පිහිටි තානායම්කන්ද හෙවත් ඉගල්කැලේ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්.ආරියසේන විසින් මැන සාදන ලද අංක 2905 සහ 2007 ජුනි මස 26 දින දරන පිඹුර ප්‍රකාර ලොට් 957 න් බෙදා වෙන් කළ කොටසක් හෙවත් ඇල්ල පාරේ වරපනම් අංක 3/4 වන ලොට් 957E නැමැති බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් උතුරට : එම ඉඩමේම ලොට් 957D ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 954 සහ 955 (වඩාත් නිවැරදිව ලොට් 955) ද, දකුණට : එම ඉඩමේම ලොට් 957F බස්නාහිරට : ලොට් 11C (පාර සඳහා වෙන්කිරීම) සහ තනබද්දේගමට වැටී ඇති ප්‍රධාන මාර්ගයද යන මායිම් තුළ පිහිටි ඉහත කී පිඹුර ප්‍රකාර පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) හෙවත් වර්ග මීටර 252,93ක් විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි පස, ගහකොළ පලතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමගය. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B477/246 යටතේ ලියාපදිංචි කර ඇත.

තවද ඉහත කී අංක 2905 දරන පිඹුර ප්‍රකාර ලොට් 11C මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ වෙනත් පරවශතා අයිතීන් ද සමග වේ.

ඉහත කී අංක 2905 දරන පිඹුරේ නිරූපිත ඉහත කී ලොට් 957E වනාහි පහත විස්තර කරනු ලබන ඉඩමේ බෙදා වෙන් කළ කොටසකි.

ඉහත කී ඇල්ල තනබද්දේගම පිහිටි තානායම්කන්ද හෙවත් ඉගල්කැලේ නමැති ඉඩමෙන් බෙදා වෙන් කළ ලොට් 957 නමැති බිම් කොටසට මායිම් උතුරට : ලොට් 952 ලොට් 953 සහ ලොට් 954 ද නැගෙනහිරට : ලොට් 954, ලොට් 955 සහ 956 ද, දකුණට : ලොට් 956, ලොට් 11B 3 සහ ලොට් 11C ද, බස්නාහිරට : ලොට් 11C සහ ලොට් 952 ද යන මායිම් තුළ පිහිටි එෆ්විපී 582 ප්‍රකාර හෙක්ටයාර බින්දුවයි දශම දෙකයි හතයි හතරයි දෙකක් (හෙ. 0.2742) විශාල බිම් කැබැල්ලය. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B477/156 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල
සමාගම් ලේකම්.

07-903

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

කේ කන්දරාජා / වෙන්වර්ස්
ගිණුම් අංක : 0042 5001 6412 / 0042 1000 5485

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010.05.31 වෙනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එන්.එස්. කලංසූරිය යන අය විසින් ලියා සහතික කරන ලද 2006 පෙබරවාරි 24 දාතම හා අංක 103 දරන හා ඩබ්ලිව්.ජී.කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2007 ජූනි 13 දාතම හා අංක 3747 සහ 3749 දරන උකස් බැඳුම්කර දෙක යන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "වෙන්වර්ස්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන ක්‍රිෂ්ණසාමි කන්දරාජා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දෙකෝටි හය ලක්ෂ තිස් තුන් දහස් දෙසිය හැත්තෑවයි ශත හැත්තෑ එකක (රු.2,06,33,270.71) මුදලක් 2010 මාර්තු 25 වෙනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද එකී රුපියල් දෙකෝටි හය ලක්ෂ තිස් තුන් දහස් සෙදසිය හැත්තෑවයි ශත හැත්තෑ එකක (රු.2,06,33,270.71) මුදලද 2010 මාර්තු 26 දින සිට අංක 103, 3747 සහ 3749 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි තිස් පන් ලක්ෂ හැට නම දහස් පන්සිය හතරයි ශත අනූ තුනක (රු. 1,35,69,504.93) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතයි දශම පහක් (17.5%), රුපියල් විසි ලක්ෂයක (රු. 20,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක්

(20%) හා තවත් රුපියල් හතලිස් ලක්ෂයක (රු. 40,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 103, 3747 සහ 3749 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි.ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කොළඹ මහ නගර සභා සීමාවන් තුල වෝඩ් අංක 42, හැව්ලොක් ටවුන්, ඉසිපතන මාවතේ පිහිටි ඉසිපතන මාවත වරිපනම් අංක 7/7 දරන බලයලත් මානක තැන එස්. ක්‍රිෂ්ණාපිල්ලෙයි යන අය විසින් සාදන ලද 2005 නොවැම්බර් 30 දාතම හා අංක 1987 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 18 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 915 දරන පිඹුරේ ලොට් 17 සහ ලොට් 23 (පාර සඳහා වෙන්කිරීම) සහ ඉසිපතන මාවත (ඉසිපතනාරාමය පන්සල) වරිපනම් අංක 45 දරන පරිශ්‍රයන් නැගෙනහිරට : ඉසිපතන මාවත (ඉසිපතනාරාමය පන්සල) වරිපනම් අංක 45 දරන පරිශ්‍රයන් දකුණට : ඉසිපතන මාවත වරිපනම් අංක 35, 37, 38 දරන ලොට් 22 සහ බස්නාහිරට : ඉසිපතන මාවත වරිපනම් අංක 7/8, අංක 915 දරන පිඹුරේ ලොට් 19 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයන් පර්චස් දහයයි දශම තුනයි හතක් (අ. 0, රූ. 0, පර්. 10.37) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාගී අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකි අංක 1987 දරන පිඹුරට අනුවය.

අංක 1987 දරන පිඹුරේ ලොට් 18 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී හැව්ලොක් ටවුන් ඉසිපතන මාවතේ පිහිටි හැව්ලොක් පාර වරිපනම් අංක 127,129,131,133,137,139,141,145 සහ 147 දරන සහ අංක 3, 7, 7/1, 11, 12, 18, 20, 15/10, 10, 17, 21, 21/1, 16, 31/1, 31, 33, 35, 37, සහ 39 (කොටසක්) ග්‍රීන්ලන්ඩ්ස් පාර බලයලත් මානක තැන එම්. එස්.ටී.පී.සේනාධීර යන අය විසින් සාදන ලද 1976 මැයි 19 දාතම හා අංක 915 දරන පිඹුරේ නිරූපිත ලොට් 18 හි නැවත මිනුමක් වන බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 18 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 23 සහ ලොට් 17, නැගෙනහිරට : ඉසිපතන මාවත (ඉසිපතනාරාමය පන්සල) වරිපනම් අංක 45 දරන පරිශ්‍රයන්, දකුණට : ලොට් 22 සහ බස්නාහිරට : ලොට් 19 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයන් පර්චස් දහයයි දශම තුනයි හතක් (අ. 0, රූ. 0, පර්. 10.37) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ එකී අංක 1987 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව A983/253 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියපදිංචි කොට ඇත.

පහත සඳහන් දැ මතින් හා ඒ දිගේ ගමන් කිරීමේ අයිතියද සමගයඃ

අංක 915 දරන එකී පිඹුරේ ලොට් 23 (පාර සඳහා වෙන්කිරීම)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්

07- 1009

---

## පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - කොටහේන ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : මෙට්ස්ටීල් (ප්‍රයිවට්) ලිමිටඩ්
පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2010.06.30 වන දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, මෙට්ස්ටීල් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායීන් වශයෙන් සහ සුරේෂ් කුමාරස්වාමි උකස්කරු (බන්ධනදායියාගේ අධ්‍යක්ෂවරයෙක්) වශයෙන් ද කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව් 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී ද ෆොන්සේකා විසින් ලියා සහතික කරන ලද අංක 285 සහ 2007.05.16 දිනැති සහ දෙකම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. කනේෂයෝගන් විසින් ලියා සහතික කරන ලද අංක 1891 සහ 2008.04.08 දිනැති සහ අංක 1889 සහ 2008.04.08 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

(අ) එකී අංක 285, 1891 සහ 1889 දරන උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2010.04.29 වන දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් අසූඅට ලක්ෂ විසිඑක් දහස් අටසිය හැටපහයි ශත විසිහය (රු. 88,21,865.26) ක මුදල සහ 2010.04.01 වන දින සිට රුපියල් අසූ ලක්ෂයක (රු. 80,00,000) මුදල මත වර්ෂයකට සියයට විසි පහ (25%) බැගින් පොළිය ද සහ රුපියල් අසූඅට ලක්ෂ විසිඑක් දහස් අටසිය හැටපහයි ශත විසිහය (රු. 8,821,865.26) ඉක්මවන මුදල මත වර්ෂයකට සියයට විසි නමය (29%) බැගින් පොළිය ද,

(ආ) එකී අංක 285 සහ 1891 දරන උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2010.04.29 වන දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දාහත්ලක්ෂ තිස්දෙදහස් එකසිය තිස්හතරයි ශත හැත්තෑඅට (රු. 17,32,134.78) ක මුදල සහ 2010.04.30 වන දින දක්වා දාහතර ලක්ෂ පනස්දෙදහස් හත්සිය අනූනවයයි ශත විසිහත (රු. 14,52,799.27) ක මුදල මත වර්ෂයකට සියයට විසි නමය (29%) බැගින් පොලිය ද,

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, පහත සඳහන් පරිදි යෝජනා සමම්ත කරගනු ලැබේ. ඒ කෙසේද යත්

(i) එකී අංක 285, 1891 සහ 1889 දරන උකස්කරයන් මත ගෙවිය යුතු එකී රුපියල් අසූඅට ලක්ෂ විසිඑක් දහස් අටසිය හැටපහයි ශත විසිහය (රු. 88,21,865.26) ක මුදල සහ 2010.04.01 දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි 1 වන සහ 2 වන අයිතමයන් වශයෙන් වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ,

(ii) එකී අංක 285 සහ 1891 දරන උකස්කරයන් මත ගෙවිය යුතු එකී රුපියල් දාහත්ලක්ෂ තිස්දෙදහස් එකසිය තිස්හතරයි ශත හැත්තෑඅට (රු. 17,32,134.78) ක මුදල සහ 2010.04.30 දින සිට

විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි 1 වන අයිතමය වශයෙන් වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, බෙල්මන්ට් වීදියේ අංක 09 හි පිහිටි එම්. එස්. ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකරු ශ්‍රියාණි මනම්පේරි වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ බටගම දකුණේ පිහිටි (බලයලත් මිනින්දෝරු එච්. රාජපක්ෂ විසින් මැන සාදන ලද අංක 2579 සහ 1998.03.10 දිනැති සැලැස්මේ ලොට් ඒ දරන කැබැල්ල නැවත මැන බෙදා වෙන් කරන ලද) බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජේ. ද සිල්වා විසින් මැන සාදන ලද අංක 6051 සහ 1999.10.09 දරන සැලැස්මේ දැක්වෙන දෙල්ගහවත්ත, ගොරකගහවත්ත, කහටගහවත්ත සහ කහටගහවත්තේ දෙකෙන් එක් පංගුවක් වන ලොට් 5 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : ලොට් ඒ දරන කැබැල්ලේ ඉතිරි කොටස, නැගෙනහිරට : පාර, දකුණට : කපුවාගර පාරේ සිට නිවාස වෙත දිවෙන පාර සහ බස්නාහිරට : ලොට් 7 යන මායිම් තුල පිහිටි එකී අංක 6051 සැලැස්ම අනුව පර්චස් තිහයි දශම දෙක (අ. 0, රූ. 0, පර්. 30.2) ක් හෝ හෙක්ටයාර් 0.0764 ක් විශාල ඉඩම. ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 422/148 වෙළුම/පිටුවෙහි ලියාපදිංචි කර ඇත.

එකී අංක 6051 සැලැස්මේ ලොට් 7 මත පොදු මාර්ග අයිතියද සමගින් වේ.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ බටගම දකුණේ පිහිටි දෙල්ගහවත්ත, ගොරකගහවත්ත, කහටගහවත්ත සහ කහටගහවත්තේ දෙකෙන් එක් පංගුවක් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඒ. කේ. ජේ. පෙරේරා විසින් මැන සාදන ලද අංක 3971 සහ 2002.05.23 දිනැති සැලැස්මේ ලොට් R වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : ලොට් Q නැගෙනහිරට : විල්ප්‍රඩ් වේරගොඩගේ ඉඩම, දකුණට : අංක 6051 සැලැස්මේ ලොට් 5 දරන කැබැල්ල සහ බස්නාහිරට : අංක 6051 සැලැස්මේ ලොට් 7 (අඩි 15 ක් පළල මාර්ගය සඳහා වෙන්කිරීම) වන මායිම් තුල පිහිටි පර්චස් නමයයි දශම පහයි බිංදුව (අ. 0, රූ, 0, පර්. 9.50) ක් හෝ හෙක්ටයාර් 0.02402 ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොල වැවිලි ආදී සියළු දේ වේ. ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 675/101 වෙළුම/පිටුවෙහි ලියාපදිංචි කර ඇත.

එකී අංක 6051 සැලැස්මේ ලොට් 7 මත පොදු මාර්ග (අඩි 15 ක් පළල පාර) අයිතියද සමගින් වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

සුදත් නැලිගම,
සහකාර කළමණාකරු - ණය අයකර ගැනීම්.

07-1006/5

---

### ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. අබේවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 904 හා 2008 පෙබරවාරි 08 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම්, "සනත් කමියුනිකේෂන් ඇන්ඩ් බුක්ෂොප්" යන නාමය අභිධානය හා ආයතනය යටතේ අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන ගීකියනගේ සනත් රූපානන්ද යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2009 අගෝස්තු 31 වන දිනට ඉහත කී අංක 904 දරන උකස් බැඳුම්කරය මත එකී ගීකියනගේ සනත් රූපානන්ද යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් දොලොස්ලක්ෂ පන්දහස් නවසිය දහහතකුත් ශත අසූහයක (රු.12,05,917.86) මුදලක් සහ 2009 සැප්තැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් නවලක්ෂ පනස්තුන් දහස් හාරසීය එකොළහකුත් ශත අසූ අටක් (රු. 9,53,411.88) සඳහා, මෙහි පහත දැක්වෙන පාදක පොලී අනුපාතික අතරින්, එනම්,

(අ) බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය

(ආ) රඳවාගැනීමේ බදු අඩු කිරීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය යන මෙයින්, ප්‍රතිශෝධන දිනයේදී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයට වර්ෂයකට සියයට දහයකුත් දශම පහක (10.5%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය යන මෙයින් ප්‍රතිශෝධන දිනයේදී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එම පොලී අනුපාතිකය එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලැබේ.

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල වන රුපියල් දොලොස්ලක්ෂ පන්දහස් නවසිය දහහතකුත් ශත අසූහයක (රු.12,05,917.86) මුදලක් සහ 2009 සැප්තැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් නවලක්ෂ පනස්තුන් දහස් හාරසීය එකොළහකුත් ශත අසූ අටක් (රු.9,53,411.88) සඳහා, මෙහි පහත දැක්වෙන පාදක පොලී අනුපාතික අතරින්, එනම්,

(අ) බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය

(ආ) රඳවාගැනීමේ බදු අඩු කිරීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය යන මෙයින් ප්‍රතිශෝධන දිනයේදී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයට වර්ෂයකට සියයට දහයකුත් දශම පහක් (10.5%) ආන්තිකයක් එකතු කල අනුපාතිකය යන

මෙයින් ප්‍රතිශෝධන දිනයේදී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 904 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

එම පොලී අනුපාතිකය එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලැබේ.

### අංක 904 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල විස්තරය

උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, මැද පත්තුවේ, අංක 185 පැරකුම් පෙදෙස ග්‍රාම නිලධාරි වසමේ, කදුරුවෙල ග්‍රාමයේ පිහිටි, සර්වේයර් ජනරාල්වරයා සකස් කළ, ඔහු භාරයේ තිබෙන, අංක. අ. ජා. පි. පො. 151 දරන පිඹුරේ ලොට් අංක 226 ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන, උතුරට : ලොට් අංක 236 ද, නැගෙනහිරට : ලොට් අංක 236, 225 හා 228 ද, දකුණට : ලොට් අංක 228 හා 236ද, බස්නාහිරට : ලොට් අංක 236 ද යන මායිම් ඇතුලත පර්චස් තිස් එකකුත් දශම එකක් (අ. 0, රූ. 0, පර්. 31.1) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

මෑතකදී කරන ලද මැනීමකට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත.

උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොලොන්නරුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුලත, මැද පත්තුවේ, කදුරුවෙල ග්‍රාමයේ පිහිටි, "කදුරුවෙල දමනකැලේ" නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ මැන සකස් කළ අංක 2007/පො/430 හා 2007.11.03 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන, උතුරට : එෆ්සීපී පො. 151 පිඹුරේ ලොට් අංක 236, නැගෙනහිරට : එෆ්. සී. පී. පො. 151 පිඹුරේ ලොට් අංක 236, 225 හා 228 ද, දකුණට : එෆ්සීපීපො 151 පිඹුරේ ලොට් අංක 228 හා 236 ද, බස්නාහිරට : එෆ්සීපීපො. 151 පිඹුරේ ලොට් අංක 236 ද, යන මායිම් ඇතුළත පර්චස් තිස් එකකුත් දශම එකක් (අ. 0, රූ. 0, පර්. 31.1) නොහොත් හෙක්ටෙයාර 0.0787 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම පොලොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

07-807/1

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලයේ විසින් සම්මත කරගනු ලැබූ යෝජනාව

ණය ගිණුම් අංක : 219190, 253923 සහ 351816
ගල්බොක්ක හේවගේ දමිත් නිරෝෂන්

2009 ජූලි මස 30 වන දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී සෙනරත් විසින් 2003 ජුනි මස 10 වන දින සහතික කරන ලද අංක 3327, 2005 අගෝස්තු මස 18 වන දින සහතික කරන ලද 4279 සහ 2007 මාර්තු මස 09 වන දින සහතික කරන ලද අංක 5089 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගල්බොක්ක හේවගේ දමිත් නිරෝෂන් ණයකරු හැටියටද පැහැර ඇති (1 වන උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති ඉඩම) හෙයින් ද සහ මාතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. සෙනරත් විසින් 2005 අගෝස්තු මස 18 වන දින සහතික කරන ලද අංක 4278 සහ 2007 මාර්තු මස 09 වන දින සහතික කරන ලද අංක 5088 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගල්බොක්ක හේවගේ දමිත් නිරෝෂන් පැහැර හැර ඇති (2 වන උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති ඉඩම) හෙයින් ද, දැන්, එකී බැඳුම්කර යටතේ රුපියල් පහලොස් ලක්ෂ දහසය දහස් හත්සිය අනූ හයයි ශත පනස් අටක (රු. 15,16,796.58) මුදලක් 2009 මාර්තු මස 25 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පහලොස් ලක්ෂ දහසය දහස් හත්සිය අනූ හයයි ශත පනස් අටක (රු.15,16,796.58) මුදල අය කර ගැනීම සඳහා 2009 මාර්තු මස 26 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 11,41,590 ක මුදල මත 33% ක වැඩි දුර වාර්ෂික පොළියක් සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් දරන ලද වෙනත් වියදම්ද සහ මෙතෙක් ලබා ගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 3327, 4279, 5089, 4278 සහ 5088 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කොට ඇත්තාවූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12 හල්ෆ්ස්ඩෝප් වීදියේ අංක 99 හි බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### ඉහත යොමු කරන ලද පළමුවැනි උපලේඛනය

අනුග්‍රහලත් මිනින්දෝරු එස්. එල්. ගලප්පත්ති විසින් 1997 සැප්තැම්බර් මස 28 වන දින සාදන ලද අංක 4041 දරන පිඹුරෙහි දැක්වෙන පරිදි, දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළය තුල මිරිස්සේ පිහිටි අට්ටික්කාගහ හෙවත් බක්කින්ගහවත්ත කියන ඉඩමේ පස්, බිම, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පවත්නා අනෙකුත් සියලුදේත් සමග බෙදා වෙන් කර ලොට් 2 ලෙස සළකුණු කර ඇති බිම් කොටසට මායිම් : උතුරට සහ නැගෙනහිරට එම ඉඩමේ ලොට් 1 ද, දකුණට පිටකොරටුව සහ බස්නාහිරට එම ඉඩමේ ලොට් 1 යන මායිම් තුල එකී

අංක 4041 දරන පිඹුරට අනුව පර්චස් විසිඑකයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 21.20) විශාල ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ D935/243 හි ලියාපදිංචි කර ඇත.

**ඉහත යොමු කරන ලද දෙවැනි උපලේඛනය**

අනුග්‍රහලත් මිනින්දෝරු එන්. විජේවීර විසින් 2002 අප්‍රේල් මස 03 වන දින සාදන ලද අංක 4813A දරන පිඹුරෙහි දැක්වෙන දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළය තුල මිරිස්සේ පිහිටි පවුවත්ත කියන ඉඩමේ ලොට්A ලොට් 1 හි ඒකාබද්ධ ලොට් 3, 4 සහ 5 පස්, බිම, වගාවන් සහ එහි පවත්නා අනෙකුත් සියළුදේත් සමග බෙදා වෙන් කර ලොට්A ලෙස සළකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ (අඩි 10 ක් පළල පාර) ලොට් 6 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් B ද දකුණට : එම ඉඩමේ ලොට් C සහ බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාරද යන මායිම් තුල එකී පිඹුරු අංක 4813A ට අනුව පර්චස් අටයි දශම නවයක් (අ. 0, රූ. 0, පර්. 8.9) හෝ හෙක්ටයාර් 0.0224 ක් විශාල ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D936/276 යොමුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

07-906

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - කොටහේන ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගණුදෙනුකරුගේ නම : රැම්කෝ සී ඇන්ඩ් එෆ් ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.26 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, රැම්කෝ සී ඇන්ඩ් එෆ් ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායියා වශයෙන් බන්ධනදායියාගේ අධ්‍යක්ෂවරයකු වන පපමාල් සිවලිංගම් උකස්කරු වශයෙන් ද කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී ද ෆොන්සේකා විසින් ලියා සහතික කරන ලද අංක 265 සහ 2006.12.15 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 265දරන උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දිනය තෙක් 2010.02.16 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් තිස් තුන්ලක්ෂ හතලිස් එක්දහස් දෙසීය පහලොවයි ශත දහඅටක (රු. 33,41,215.18) ක මුදල සහ 2010.02.05 වැනි දින සිට රුපියල් දහනව ලක්ෂ හතලිස් හතර දහස් හාරසිය හැටහතරක (රු. 19,44,464) මුදල මත වර්ෂයකට සියයට විසි පහ (25%) ක් බැගින් පොළිය ද 2010.02.17 වැනි දින සිට රුපියල් දහතුන් ලක්ෂ විසිදහස් නමසිය හැටනවයයි ශත අනූතුනක (රු. 13,20,969.93) මුදල මත වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් පොළිය ද පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්

